

රාජ්‍ය දැව සංස්ථාව

වාර්ෂික වාර්තාව 2021

දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය උදෙසා

1968-2021

53 වසරක නොනිමි ගමන් මග
රාජ්‍ය දැව සංස්ථාව

ජනහද දිනූ ආයතනයක් ලෙස පෙරටම

දැක්ම

ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයුම්කරුවීම සහ දැව වෙළෙඳපොළෙහි සැබෑ නායකත්වය ඉසිලීම.

මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම, කීර්තිනාමය හා නිපුණතාවය උපයෝගී කරගනිමින් නීත්‍යානුකූලව, පරිසරහිතකාමී අන්දමින් ජාතික අවශ්‍යතාවය අනුව අපගේ ගැනුම්කරුවන්ගේ දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම නිෂ්පාදනය කර ලබාදීම.

අපේ කථාව

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968.04.04 දිනැති හා අංක:14796 දරණ ගැසට් පත්‍රය මගින් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරණ රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1969 නොවැම්බර් 07 දිනැති අංක 14879 දරණ ගැසට් පත්‍රය, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 අති විශේෂ ගැසට් නිවේදනය, 2001 වර්ෂයේ ජූනි 26 දිනැති අංක:1190/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය සහ 2008 පෙබරවාරි 25 දිනැති අංක:1538/7 දරන ගැසට් පත්‍ර අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5 කි. වර්ෂ 53කට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද ඇති ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ අවශ්‍යතා ඇති හෝටල් හිමිකරුවන්ගේ, රජයේ ආයතනවල සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ඇතුළු පෞද්ගලික ගැනුම්කරුවන්ගේ ප්‍රමුඛ තේරීමක් බවට පත්ව ඇත.

රාජ්‍ය දැව සංස්ථාව ඉහළ ගුණාත්මක බවින් යුතු අනර්ඝතම දැවමය නිෂ්පාදන පාරිභෝගිකයින් හට සැපයීමට හා උපරිම සේවාවක් ලබාදීමට හැකි සෑම අවස්ථාවකදීම උත්සාහ දරයි. අලංකාර නිවාස, සුඛෝපභෝගී හෝටල්, විධායක කාර්යාල ඇතුළු විදේශීය වාසස්ථාන සඳහා ද, අපගේ අනර්ඝ දැව ඉහළ වටිනාකමක් එක් කරයි. මනා ලෙස කළමනාකරණය කරන ලද වනවගා මඟින් ලබාගනු ලබන වටිනා දැව මඟින් කරනු ලබන සුවිශේෂී නිෂ්පාදන වන කාර්යාල හා නිවාස සඳහා වූ ගෘහ භාණ්ඩ, කඳන් හා ඉරෑ දැව අපගේ පාරිභෝගිකයන් උපරිම තෘප්තිමත්භාවයට පත්කිරීමට සමත් වේ. කීර්තිමත් රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව පුළුල් පරාසයක පැතිරුණ ඉහළ පෙළේ හා දීර්ඝ කල්පැවැත්මක් ඇති දැවමය නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන අතර, නිෂ්පාදන නවීන තාක්ෂණයෙන් යුතු අධි තාක්ෂණික යන්ත්‍රෝපකරණවලින් සමන්විත නවීන වැඩ පරිසරයක් තුළ නිපදවනු ලබයි.

සිත්ඇදගන්නා සුළු අසුන්වල සිට සුවිශේෂී නිදන කාමර කට්ටලයන් දක්වා පාරිභෝගිකයන් විසින් ඉල්ලුම් කරනු ලබන මිලට හා කාල වකවානුව තුළ ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව, නිෂ්පාදන ලබාදීමේ හැකියාව රාජ්‍ය දැව සංස්ථාව සතුව පවතී. අපගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය අප විසින් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගන්නා පහත දක්වා ඇති ක්‍රියාමාර්ග තුළින් සනාථ කරනු ලබයි.

- නිරසාරව කළමනාකරණය කරන ලද වනවගා මඟින් ලබාගනු ලබන පරිණත දැව අපගේ නිෂ්පාදනයන් සඳහා යොදාගනු ලැබීම.
- ඵලය හා දෝෂ රහිත, ඉහළ ශ්‍රේණියේ දැව භාවිතා කරනු ලැබීම.
- මනා ලෙස පරිරක්ෂණය කරන ලද දැව භාවිතය.
- නවීන නිෂ්පාදන ක්‍රියාවලි සඳහා යන්ත්‍රෝපකරණ භාවිතය.
- ගුණාත්මකභාවය සහ සහතික කරන ලද අනෙකුත් දැව නොවන අමුද්‍රව්‍ය භාවිතය.
- එකලස් කිරීමේ හා නිම කිරීමේ නවීන ශිල්පක්‍රම භාවිතය.

නිෂ්පාදනවල ගුණාත්මකභාවය හැරුණුවිට, සංස්ථාව මඟින් සපුරාලනු ලබන සියලුම ආකාරයේ ගෘහ භාණ්ඩ අවශ්‍යතා සඳහා නොමිලේ ඇස්තමේන්තු කිරීමේ සේවාවක් සහ මිනුම් සේවාවක් සපයනු ලබයි. තවද, ඉහළ ප්‍රතිලාභ සහිත අපගේම පිරිවිතරයන්ට අනුව නිෂ්පාදනය කරන ලද උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩ පරාසයක් වෙළෙඳපොළට සැපයීමට අපි සහතික වෙමු. අපගේ නිෂ්පාදන පරාසයන් පුළුල් කිරීමට අමතරව විශේෂයෙන් අපගේ සේවාවන් සහ ගනුදෙනුකරුවන් සඳහා සේවා පරිසරය ද අපි නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ද සහතික වෙමු.



වත්නම්
රු.මිලියන 9208



සේවකයන්
1606



අලෙවි ආදායම
රු.මිලියන 5696



වගකීම්
රු.මිලියන 2451

අපගේ කාර්යයන්



මූල්‍ය වශයෙන් ස්ථායී වේ



නිවාස හා සේවා ස්ථාන ඉදිකිරීම සඳහා තිරසාර අමුද්‍රව්‍ය සපයනු ලැබේ



තිරසාර වන කළමනාකරණ ක්‍රමෝපායන් යොදාගනිමින් පරිසරය ආරක්ෂා කිරීමටත් වර්ධනය කිරීමටත් දායක වේ



ආදායම් බදු හා භාණ්ඩාගාර බදු ගෙවමින් ප්‍රජා සංවර්ධනය සඳහා දායක වේ



පුළුල් පරාසයක පැතිරුණ නවීන හා සම්ප්‍රදායක ගෘහ භාණ්ඩ සපයනු ලැබේ



රාජ්‍ය දැව සංස්ථාව
STATE TIMBER CORPORATION



පටුන

මූල්‍ය ප්‍රකාශන උද්ධෘත	8
ආයතනික තොරතුරු	9
කළමනාකරණ මඩුල්ල	10
සභාපතිතුමාගේ සමාලෝචනය	13
සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය	15
අපගේ කාර්යභාරයන් හා අපගේ ව්‍යාපාරික වටිනාකම්	18-19
අධ්‍යක්ෂ මණ්ඩලය	20
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල	21
අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය	22
අපගේ ආවරණ කලාප	27
ආයතනික පාලනය	29
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	31
අවදානම් කළමනාකරණය	33
ආයතනික සමාජ වගකීම	38
ව්‍යාපාරික සාරාංශය	46
දශකයක තොරතුරු	49
විගණකාධිපතිගේ වාර්තාව	50
වාර්ෂික ගිණුම්	62
මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව	83

මූල්‍ය ප්‍රකාශන උද්ධෘත

ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත		2021	2020	වෙනස %
ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත				
අයභාරය	රු. '000	5,695,663	3,981,688	43%
භාණ්ඩාගාර හා ආදායම් බදුවලට පෙර ලාභය	රු. '000	1,496,156	569,521	163%
භාණ්ඩාගාරයට ගෙවූ බදු	රු. '000	100,000	511,026	-80%
ආදායම් බදු	රු. '000	259,944	105,615	146%
වර්ෂය සඳහා විස්තීරණ ආදායම්	රු. '000	1,236,212	463,907	166%
ස්කන්ධය මත ඉපැයීම්	%	18.0	8.0	125%
වත්කම් මත ඉපැයීම්	%	13.0	6.0	117%
ශේෂ පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත				
මුළු වත්කම්	රු. '000	9,207,819	7,286,194	26%
මුළු ස්කන්ධය	රු. '000	6,757,207	5,464,633	24%
මුළු වගකීම්	රු. '000	2,450,612	1,821,561	35%
ණය/ස්කන්ධය	%	36.3	33.3	9%
ණය/මුළු වත්කම්	%	26.6	25.0	6%
වෙනත් තොරතුරු				
මුළු සේවකයන්	No.	1,606	1,708	-6%
එක් සේවකයෙකුට අයභාරය	රු. '000	3,546	2,331	52%
එක් සේවකයෙකුට ලාභය	රු. '000	932	333	179%







ආයතනික තොරතුරු - 2021

ගරු ආර්.එම්.සී.බී.රත්නායක මහතා	- වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යතුමා
සෝමරත්න විදානපතිරණ මහතා	- ලේකම්, වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය - 2021

උයද සී. වලිසිංහ මහතා	- සභාපති - රාජ්‍ය දැව සංස්ථාව
බී.එන්. ගමගේ මහත්මිය	- අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත)
ආචාර්ය කේ. එම්. ඒ. බණ්ඩාර මහතා	- අධ්‍යක්ෂ (වන සංරක්ෂණ ජනරාල්)
බී.ඒ. ධර්මරත්න මහතා	- අධ්‍යක්ෂ
පී.ඩී. ප්‍රීති ගුණතිලක මහතා	- අධ්‍යක්ෂ
එච්.කේ.එම්.පේ.එච් කුමාරසිංහ මහතා	- අධ්‍යක්ෂ
පී.කේ. ප්‍රසන්න මහතා	- අධ්‍යක්ෂ
එම්.ජී. දිලානි ශාරිකා මහත්මිය	- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

විගණන හා කළමනාකරණ කමිටුව

බී.එන්.ගමගේ මහත්මිය	- කමිටු සභාපතිනි
එච්.කේ.එම්.පේ.එච් කුමාරසිංහ මහතා	- කමිටු සාමාජික
පී.කේ.ප්‍රසන්න මහතා	- කමිටු සාමාජික

විගණක

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

දුරකථන : 94112866600-5
ෆැක්ස් : 94112866623
වෙබ්අඩවිය : www.timco.lk

කළමනාකරණ මඩුල්ල - 2021

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී	ආචාර්ය නිමල් රුවන්පතිරණ	Phd (Foresty), M.Sc (Forestry), B.Sc

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්		
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	පී.ඩී.එස්. කුමාරසිංහ මයා	MBA, B.Sc. (Acc.Fin.Mgt), ACA, ACMA
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)	එම්.ඒ.සී.එන්. සමරසිංහ මයා	MPM, B.Sc (Business Studies), Ad.Dipl in Mgt & Admin
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)	එම්.සී. දේවේන්ද්‍ර මයා	M.Sc (Forestry), B.sc
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)	ඩබ්.බී.සමන්ත මයා	M.Sc (Forestry), B.Sc, N.Dip in Teaching)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු හා නිෂ්පාදන) වැ.ආ	පී..පී.ටී. ගමගේ මයා	B.Sc

සහකාර සාමාන්‍යාධිකාරීන්		
සහකාර සාමාන්‍යාධිකාරී (කලාප)	පී.කේ. අජිත් චන්දන මයා	B.Sc
සහකාර සාමාන්‍යාධිකාරී (කලාප)	එච්.බී. රජවත්ත මයා	B.A
සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ, සංවර්ධන හා පුහුණු)	ආචාර්ය සී.කේ. මුතුමාල	PhD. (Agri. Engineering) M.Sc. (Forestry), B.Sc. (Agri.) Sp. Hon.

කළමනාකරුවන්		
කළමනාකාර (සිල්පර හා විදුලිකණු)	ඩී.එම්.එන්.පුෂ්පකුමාර නිල්මිණි මයා	B.Sc
කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු)	ඒ.කේ. ලසිත එඩිමන්ඩ් මයා	B.Sc. (Engineering)
කළමනාකාර (අභ්‍යන්තර විගණන)	එච්.එම්.එස්. මාධව මයා	B.com (Sp)
කළමනාකාර (මුදල්)	පී.ටී.එන්. බෝවත්ත මිය	
කළමනාකාර (මුදල්)	එච්.පී.ආර්. විජේනායක මයා	
කළමනාකාර (මුදල්) වැ.ආ	යූ.එස්. මඩවල මයා	HNDA, MAAT
කළමනාකාර (නීති)	කේ.අයි.ඩී.පී කාරියවසම් මිය	LLB, Attorney at Law
කළමනාකාර (තොරතුරු තාක්ෂණ)	ජේ.එම්.එම්.ඩී ජයසුන්දර මයා	B.Sc. (sp) Hon.
කළමනාකාර (ආරක්ෂක)	සී. වීරමන් මයා	

ප්‍රාදේශිය කළමනාකාරුවන්

ප්‍රාදේශිය කළමනාකාර (ප්‍රධාන කාර්යාලය)	ආර්. විජේතුංග මයා	B.Sc(Agri.)Sp
ප්‍රාදේශිය කළමනාකාර (ප්‍රධාන කාර්යාලය)	එම්.ඩී.සී. සම්පත් මයා	BA
ප්‍රාදේශිය කළමනාකාර (ප්‍රධාන කාර්යාලය)	යූ.පී.එච්. උළුවඩුගේ මයා	B.Sc
ප්‍රාදේශිය කළමනාකාර (ප්‍රධාන කාර්යාලය)	ඩී.එච්. රාජපක්ෂ මයා	M.Sc (Forestry), B.Sc
ප්‍රාදේශිය කළමනාකාර (කොළඹ) වැ.ආ.	එච්.ඒ. ගාමිණී අල්විස් මයා	
ප්‍රාදේශිය කළමනාකාර (මොණරාගල) වැ.ආ.	එස්.සී ජයමාන්න මයා	B.Sc
ප්‍රාදේශිය කළමනාකාර (අනුරාධපුර) වැ.ආ.	ඩී.එල්. අබේනායක මයා	
ප්‍රාදේශිය කළමනාකාර (අම්පාර) වැ.ආ.	ආර්.සී. සමන් කුමාර මයා	
ප්‍රාදේශිය කළමනාකාර (රත්නපුර)	එච්.එල්. නන්දන මයා	B.Sc
ප්‍රාදේශිය කළමනාකාර (යාපනය)	ශ්‍රී ස්කන්ධරාසා මයා	
ප්‍රාදේශිය කළමනාකාර (කුරුණෑගල)	එච්.පී.එස්. දිසානායක මයා	BA
ප්‍රාදේශිය කළමනාකාර (මාතර)	ඩබ්.අයි. සාරංග මයා	B.Sc (Hon)
ප්‍රාදේශිය කළමනාකාර (මින්නේරිය) වැ.ආ.	එම්.ඩබ්.ඩබ්.බී මුදන්නායක මයා	
ප්‍රාදේශිය කළමනාකාර (නුවර) වැ.ආ.	ඩී.ඒ. හෙන්දාවිතාරණ මයා	
ප්‍රාදේශිය කළමනාකාර (නුවරඑළිය) වැ.ආ.	ඩබ්.ඩී.පී.පී. ජයසේකර මයා	
ප්‍රාදේශිය කළමනාකාර (බණ්ඩාරවෙල) වැ.ආ.	සුනිල් ජයරත්න මයා	

නියෝජ්‍ය කළමනාකරුවන්

නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ හා තත්ත්ව ආරක්ෂණ)	ඊ.එම්.එම්. ප්‍රනාන්දු මයා	
පද්ධති විශ්ලේෂක	ඩබ්.එච්.ඒ. චන්ද්‍රකුමාර මයා	B.Sc
නියෝජ්‍ය කළමනාකාර (මානව සම්පත්)	එච්.පී. පෙරේරා මිය	
නියෝජ්‍ය කළමනාකාර (මානව සම්පත්)	කේ.එස්. අබේනායක මිය	
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - ප්‍රධාන කාර්යාලය)	එච්.එම්.පී.බී. හේරත් මයා	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - බ්‍රූස්ස)	ඒ.එල්. තුෂාරි ද සිල්වා මිය	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - නුවරඑළිය)	එන්.ටී.එස්.කේ.පී. තිලකවර්ධන මයා	HNDA, MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - නුවර)	ඩබ්.එම්.පී.එම්. විජේසිංහ මයා	B.Sc(Busi.Admin), MAAT
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - මොණරාගල)	ඒ.ජේ. පුෂ්පකුමාර මයා	B.Sc (Bus.Admin)
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - මින්නේරිය)	එම්.ඩී.පී.එම්. දිසානායක මිය	B.Sc (Acc)
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - ප්‍රධාන කාර්යාලය)	ඩී.එන්. විජේසූරිය මිය	B.Sc (Acc), CTA
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - ප්‍රධාන කාර්යාලය)	එස්. විතානගේ මිය	
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - අනුරාධපුර)	ඩබ්.කේ. ජයසිංහ මයා	
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - කොළඹ)	එස්.පී.ඒ.ජේ.සී. සමරකෝන් මයා	B.Sc (Finance)
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - බණ්ඩාරවෙල)	එස්.එම්. හේවගේ මයා	B.Sc (Bus.Admin)
නියෝජ්‍ය කළමනාකාර (මුදල් - කුරුණෑගල)	එස්.එච්.අයි. ප්‍රසාද් මයා	B.Sc (Bus.Admin)
නියෝජ්‍ය කළමනාකාර (මුදල් -කැප්පෙටිපොළ)	ඩී.කේ.පී.පී. පුෂ්පකුමාර මයා	B.Com
නියෝජ්‍ය කළමනාකාර (අලෙවි)	ඩබ්.ඩී.ඒ.එස්. තිලකරත්න මයා	
නියෝජ්‍ය කළමනාකාර (දැව ශ්‍රේණිකිරීම් හා වෙන්දේසි)	ඩී.පී.කේ.එස්.පී. සමරවික්‍රම මයා	B.Sc (Mkt.Mgt)

නියෝජ්‍ය කළමනාකාර (දැව සැපයිම්)	බී.ඒ. නලින් දේශප්‍රිය මයා	
නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ නිර්මාණ)	එච්.එම්.ටී.එස්. අබේරත්න මිය	B.Des.(Hons), MBA in MOT
නියෝජ්‍ය කළමනාකාර (ඉරුම්හල්)	එම්.පී.එන්. අරුණ ශාන්ත මයා	B.Sc (Bus.Admin)
නියෝජ්‍ය කළමනාකාර (විමර්ෂන)	එස්.ඒ.ඩී. නිරෝෂන් මයා	B.Sc (Bus.Mgt)
නියෝජ්‍ය කළමනාකාර (යාන්ත්‍රික ඉංජිනේරු)	එම්.කේ.එම්. අක්තාර් මයා	B.Tech
නියෝජ්‍ය කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ)	එච්.එම්.එල්.කේ.පී. හේරත්	B.Sc
නියෝජ්‍ය කළමනාකාර (තත්ත්ව ආරක්ෂණ)	ඩබ්.එම්.අයි.එච්. වීරසූරිය මයා	B.Sc
නියෝජ්‍ය කළමනාකාර (නිෂ්පාදන)	අයි.එම්.අයි.එස්.කේ. වික්‍රමසිංහ මයා	PgD (Fin, & Mathematics), B.Sc
නියෝජ්‍ය කළමනාකාර (මිලදීගැනීම් හා නාවික) වැ.ආ. (ප්‍රධාන කාර්යාලය)	එච්.ඩී.එස් සඳමාලි මිය	B.B.Mgt (HR) Sp.

ගෘහභාණ්ඩ සංකීර්ණ කළමනාකරුවන්

නියෝජ්‍ය කළමනාකාර (අම්පාර)	ආර්.එස්. පල්ලියගේ මයා	B.Sc (Bus.Admin)
නියෝජ්‍ය කළමනාකාර (කල්දෙමුල්ල)	එච්.එම්.යු.පී. සෝමවීර මයා	BLE, Dip IT & Mgt

නියෝජ්‍ය ප්‍රාදේශිය කළමනාකරුවන්

නි.ප්‍රා.ක. (මින්නේරිය)	කේ.එම්.පී.ටී.සී. කපිලරත්න මයා	
නි.ප්‍රා.ක. (අම්පාර)	යූ.ජේ.පී. ඒකනායක මයා	
නි.ප්‍රා.ක. (මහනුවර)	ඩබ්.ඒ.එස්. විජේසේකර මයා	
නි.ප්‍රා.ක. (යාපනය)	ටී.පී. රමේෂ් මයා	
නි.ප්‍රා.ක. (මාතර)	කේ. චන්ද්‍රසේන මයා	
නි.ප්‍රා.ක. (කොළඹ)	ඊ.එම්.ඒ.කේ. එදිරිසිංහ මයා	
නි.ප්‍රා.ක. (කොළඹ)	එස්.බී. උඩගෙදර මයා	BA
නි.ප්‍රා.ක. (මොණරාගල)	පී. හෙට්ටිආරච්චි මයා	B.Sc
නි.ප්‍රා.ක. (කුරුණෑගල)	එස්.ඒ මනෝජ් තුෂාර මයා	
නි.ප්‍රා.ක. (කුරුණෑගල)	ආර්.පී.පී.ඩී. ජයසිංහ මයා	
නි.ප්‍රා.ක. (කුරුණෑගල)	එස්.එම්.එස්. සිරිවර්ධන මයා	

සභාපතිතුමාගේ සමාලෝචනය



අභියෝගාත්මක වර්ෂයන් තුළ රාජ්‍ය දැව සංස්ථාව ප්‍රශංසනීය කාර්යසාධනයක් ලබාදුන් බව වාර්තා කිරීමට මම සතුටු වෙමි. වසර පුරා අපගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ශ්‍රම බලකායේ අනුවර්තනයවීමේ හැකියාව සහ නම්‍යතාවය මූලික විය.

2021 වර්ෂය තුළ සංස්ථාව අභියෝග රැසකට මුහුණ දී තිබියදීත්, ඒ සඳහා ඉතා සාර්ථකව මුහුණදීමට හා ස්ථාවරව රැඳීසිටීමට හැකියාව ලද අතර,එසේ නොසැලිසිටීමට මූලිකවම හේතුවූයේ අප කාර්ය මණ්ඩලයෙහි සියලුදෙනා තුළ වූ ධනාත්මක ආකල්පයයි. මෙම අභියෝගාත්මක අවස්ථාවේදී, විශේෂයෙන් අප රටේ ජනතාවට සේවය කිරීම සඳහා ප්‍රධාන කාර්යභාර්යයක් ඉටු කිරීමට හැකිවීම හා, ඔවුන්ගේ දායකත්වය ලබාගැනීමට හැකිවීම පිළිබඳව මා සතුටට පත්වන්නෙමි. සංස්ථාවෙහි මූල්‍ය ස්ථායීතාව පවත්වා ගැනීමට හා අභියෝග හමුවේ නොසැලී සිටීම උදෙසා සිදුකරන ලද පිරිවැය අවම කිරීම් හා ඵලදායීතාව ඉහළනැංවීමේ ක්‍රියාමාර්ග සඳහා උපරිම සහයෝගය ලබාදීම හා නව ක්‍රමවේදයන් ස්ථාපනය කිරීමේදී ඒ සඳහා අනුගතවීම, අභියෝගාත්මක පරිසරය තුළ අරමුණු ඉටුකරගැනීමට මූලික වශයෙන් ඉවහල් විය. වසංගතයේ බලපෑම තිබියදීත්, අප සංස්ථාවෙහි දූරදර්ශී හා ක්‍රියාශීලී ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා 163% ක ලාභ වර්ධනයක් සහිතව රුපියල් මිලියන 1496 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට අප සංස්ථාව සමත් වී ඇත. රාජ්‍ය දැව සංස්ථාව තුළ ආරක්ෂක පියවරයන් සහ ප්‍රමිතීන් සඳහා සෑම විටම විශාල වැදගත්කමක් ලබා දී ඇත. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කර ඇති මාර්ගෝපදේශ පවත්වා ගනිමින් දැඩි කොවිඩ් 19 ආරක්ෂාකාරී ක්‍රියා පටිපාටි ඇතුළත් කරමින් අපගේ ආරක්ෂක පියවරයන් සහ ප්‍රමිතීන් තවදුරටත් ඉහළ නංවන ලදී.

2021 වර්ෂය අපගේ මූලික ශක්තීන්, නව්‍ය හා උසස් තත්ත්වයේ නිෂ්පාදනයන් නිෂ්පාදනය කෙරෙහි විශාල වශයෙන් අවධානය යොමු කළ වසරකි. නව සාමාන්‍ය තත්වයන් යටතේ අපගේ මෙහෙයුම් කටයුතු දැඩි ආරක්ෂක පියවරයන් සහ අභිප්‍රේරිත කාර්ය මණ්ඩලයක් සමඟ ආරම්භ විය. ඒ අතරම අපි නැවත වරක් අපගේ පාරිසරික හා සමාජ සංස්කෘතික කාර්ය සාධනය ඉහළ මට්ටමකින් පුළුල් කළෙමු.

මානව සම්පත යනු අප සංස්ථාව සතු ඉතා වටිනාම සම්පත බව අපගේ විශ්වාසයයි. අපගේ ගනුදෙනුකරුවන්ට හැකි උපරිම මට්ටමින් සේවය කිරීමට කැපවී සිටින හා සංස්ථාවේ ඉලක්ක සපුරාගැනීමට තම කාර්ය නොපිරිහෙලා ඉටුකරන අපගේ කාර්ය මණ්ඩලයේ පුහුණු හා සංවර්ධන වැඩසටහන් සඳහා 2021 වර්ෂයේ දී ද අප ආයෝජනය කළෙමු.

මූල්‍ය කාර්යසාධනය

2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 5,696 ක අලෙවි ආදායමක් ළඟාකර ගැනීමට සංස්ථාවට අවස්ථාව උදා වූ අතර, පෙර වර්ෂයේ රුපියල් මිලියන 3,982 ක් වූ අලෙවි ආදායමට සාපේක්ෂව මෙය 43% ක ඉහළයාමකි. ආදායම් බදු පෙරලාභය රුපියල් මිලියන 1,496 ක් හා බදු පසු ලාභය රුපියල් මිලියන 1,135 ක් ලෙස වාර්තා කිරීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකිවිය. මෙම විජයග්‍රහණයත් සමඟ රජය සතු සංස්ථාවක් (ආයතනයක්) ලෙස මෙම දුෂ්කර කාලසීමාව තුළ බදු ගෙවීමෙන් පසු ලාභයෙන් රු.මිලියන 100 ක් භාණ්ඩාගාර බදු ලෙස ලබාදීමට හැකිවීම පිළිබඳ අපි ආඩම්බර වෙමු.



ඒ හා සමානව, බදු ගෙවීමට පෙර සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) 2021 වර්ෂයේ දී 15% ක් ලෙස වාර්තා වන අතර, එය 2020 වර්ෂයේ අගය එනම් 6% ට සාපේක්ෂව ඉහළයාමකි. 2020 වර්ෂයේ දී 8% ලෙස වාර්තා වූ බදු පසු සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ ද (ROE) 2021 වර්ෂයේ දී 18% දක්වා ඉහළගොස් ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ සියලු වත්කම් හා කොටස් ආදායම උත්පාදනය සඳහා විශාල දායකත්වයක් ලබාදී ඇති බව හා සංස්ථාව සුදුසු කාරක ප්‍රාග්ධන කළමනාකරණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන බව මෙමඟින් හෙළිවේ.



ඉදිරි මාවත

කොවිඩ් 19 වසංගතය ලොව පුරා අවිනිශ්චිතතාවයක් අඛණ්ඩව ඇති කරමින් සිටින බැවින් සංස්ථාව දැව කර්මාන්තය සහ සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය උදෙසා ඉදිරි වර්ෂයේ දී ඇතිවිය හැකි බාධක නොතකා නොපසුබට උත්සාහය හා වර්ධනයක් ළඟා කරගැනීමට අප තුළ ඇති නොසැලෙන හැකියාව මත අපි ශක්තිමත්ව සිටින්නෙමු. නව විශ්වාසයකින් යුතුව අපි ඉදිරි ගමනකට අවශ්‍ය පරිදි අනුවර්තනය වී ඉදිරි වසර සඳහා අප විසින් සකස් කර ඇති ඉලක්ක කරා ළඟා වෙමු.

අපි අභියෝගාත්මක නව වසරකට පිවිසෙන බැවින් සංස්ථාව මඟින් නිරතුරුව තත්ත්ව විශ්ලේෂණයන් සිදුකරනු ලබන අතර, එම විශ්ලේෂණයන්හි ප්‍රතිඵල මත පෙර සකස් කරන ලද සැළසුම් සමාලෝචනය කරන්නෙමු. නමුත් පසුගිය වසරවල සාර්ථකත්වය ගෙන ඒමේ ක්‍රියාවලියේ දී වැදගත් ලෙස සනාථ වූ "සංස්ථාවෙහි ශක්තිමත් පදනම, ශක්තිමත් උපාය මාර්ග මෙන්ම ව්‍යාපාර ආකෘතිවල ඔරොත්තුදීමේ හැකියාව සහ ක්‍රියාශීලී බව" ඉදිරි අභියෝග ජයගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට ඉවහල් වනු ඇති බවට අප විශ්වාස කරමු.

අපගේ මූලික ව්‍යාපාරය ගොඩනැඟීමට හා වර්ධනය කිරීමට ඇති අවස්ථාවන් උපයෝජනය කරමින් අභියෝග යන්ට සාර්ථකව මුහුණදීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකියාව හා පෙර සූදානම ඇති බව මාගේ විශ්වාසයයි. ඒ අතරම අපගේ වර්ධන ගමනට මග සළසන අපගේ වෙළෙඳ නාමය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ආයෝජනයන් හා අපගේ සාර්ථකත්වයට ඉවහල් වන ශේෂ පත්‍රයෙන් පරිබාහිර සාධක ද ශක්තමත් කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. "අපගේ පාර්ශවකරුවන් සඳහා අපව විසින් නිර්මාණය කරනු ලබන වටිනාකම් තවදුරටත් ඉහළ නැංවීමේ අපේක්ෂාව" විසින් අපව ඉදිරියටම මෙහෙයවනු ලබන බව මම අවධාරණය කරමි. එම අපේක්ෂාවට අනුගාමීව සමාජීය හා පාරිසරික වගකිව යුතු සංවිධානයක් ලෙස අපගේ අනන්‍යතාවය ශක්තිමත් කිරීමට කටයුතු කරන අතරම, අපගේ පාර්ශවකරුවන් හට තිරසාර වටිනාකමක් ලබාදීම සහතික කිරීම සඳහා රාජ්‍යදැව සංස්ථාව සිය පූර්ණ අවධානය යොමු කරනු ඇත.

මාගේ කෘතඥතාවය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමාටත් අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, වනසංරක්ෂණ ජනරාල්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලු කාර්ය මණ්ඩලයටත්, අනෙකුත් සියලු රජයේ නිලධාරීන්ටත්, අපහට ලබාදුන් සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මා සභාපතිවරයා ලෙස සේවය කළ මෙම කාලය තුළ, **2021 වර්ෂයේ ලබාගත් පිරිවැටුම මෙන්ම ලාභය රාජ්‍ය දැව සංස්ථාවේ වසර 53 ක ඉතිහාසයේ වාර්තා වූ ඉහළම පිරිවැටුම හා ලාභය වේ**. ඒ සඳහා මාහට දායකවීමට හැකිවීම පිළිබඳව මා අවංකව සාඩම්බරයට පත්වෙමි. එසේම, මෙම ජයග්‍රාහී අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සහය දැක්වූ රාජ්‍ය දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා ඇතුළු ඉහළ නිලධාරි මඩුල්ලට මෙන්ම, සෑම සේවකයෙකු හටම මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි.

2022 වර්ෂය පහසු වසරක් වනු ඇතැයි අප බලාපොරොත්තු නොවෙමු. කෙටි කාලීන අභියෝග කෙරෙහි නොනැවතී, දීර්ඝකාලීනව අවධානය යොමු කරන්නෙමු. අපගේ ඉලක්ක ලඟා කරගනිමින් අපගේ පාර්ශවකරුවන්ට ඉහළ ප්‍රතිලාභ ලබාදීමට අප කැපවී සිටින්නෙමු. අනාගතයේ දැව වෙළෙඳපොළේ ප්‍රමුඛතම වෙළෙඳ නාමය හා සැබෑ නායකයා බවට රාජ්‍ය දැව සංස්ථාව පත්කරන බවට අවසාන වශයෙන් සියලුම පාර්ශවකරුවන්ට සහතික වෙමි.



උදය සී. වලිසිංහ

සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

සාමාන්‍යාධිකාරී (ප්‍රධාන විධායක නිලධාරී) සමාලෝචනය



2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික මූල්‍ය හා විගණන ප්‍රකාශයන්, මූල්‍ය තත්ත්වය, විස්තීරණ ආදායම, මුදල් ප්‍රවාහයේ වෙනස්වීම්, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය සහ වෙනත් දේ ඇතුළත්ව සමාලෝචනය කිරීමට ලැබීම ගැන ආයතනයේ සාමාන්‍යාධිකාරී (ප්‍රධාන විධායක නිලධාරී) වශයෙන් මම සතුටු වෙමි. 2021 වසර තුළ මගේ මඟපෙන්වීම යටතේ සිදු කරන ලද පැහැදිලි කිරීම්, තොරතුරු, මගේ අදහස් සහ නිරීක්ෂණ එම සලකා බලන ලද මෙහෙයුම් වසර අවසන් වන විට ඉලක්කගත ප්‍රතිඵල සාර්ථක කර ගැනීමට සංස්ථාව මෙහෙය වූ බව මම විශ්වාස කරමි.

ගෝලීය කොරෝනා වසංගතයක් මධ්‍යයේ ලද විජයග්‍රහණය

2021 වසර සුවිශේෂී වසරක් විය. 2021 වසරේ මුල්භාග යේදී එය ඉතා අසීරු කටුක කාලයක් ලෙස හැඟුණද ද, වසර අවසානය වන විට ගෙවීගිය වසර හොඳම වසරක් වී ඇති බව මා හට පසක් විය. ඒ මන්දයත්, පසුගිය වසර වෙළෙඳපොළේ ප්‍රගතිශීලීත්වය සඳහා අප විසින් දිගුකාලීන වෑයමක් දැරූ වසරක් වූ බැවිනි. රටේ වෙළෙඳපොළ විවෘත කිරීමට සහ ක්‍රියාත්මක වීමට ඉඩ නොදී සාධාරණ හා ක්‍රමානුකූලව ක්‍රියාත්මක වීමට නොහැකි වන පරිදි දීප ව්‍යාප්ත කොරෝනා ඇඳිරිනීතිය පනවා ඇති අවධියක රාජ්‍ය දැව සංස්ථා ගබඩා විවෘතව තැබුණි. 2021 වසර තුල එහි උච්චාවචනයන් වුවත් එය සාධාරණ හේතූන් මත සිදුවී ඇති බව පසුවිපරමේදී අප හට වැටහුණි. 2021 වසරේ මුල් මාසවලදී, දීප ව්‍යාප්ත කොරෝනා ඇඳිරිනීති දැමීමට පෙර, ලොව පුරා අනෙකුත් වෙළෙඳපොළවල් මෙන්ම, දැව සහ දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ සඳහා ද කොරෝනා වසංගතය දැඩි ලෙස බලපෑවේය. දැව වෙළඳපොළ සාර්ථකත්වය කරා ගෙන යාමට සම්පත් සහ තාක්ෂණික නවෝත්පාදන පමණක් ප්‍රමාණවත් නොවේ. වෙළඳපොළ හොඳින් සිදු වීමට නම්, පාරිභෝගිකයින්ට වෙළඳපොළ කෙරෙහි විශ්වාසයක් තිබිය යුතුය. නිෂ්පාදනය වැඩි කිරීමට මෙන්ම විශ්වාසදායිව අලෙවිය පවත්වා ගැනීමට ඇඳිරිනීති දමන ලද දුෂ්කර කාල පරිච්ඡේදය තුළද සැලකිය යුතු වේගයකින් කල්පනාකාරීව ක්‍රියාත්මක වීමට රාජ්‍ය දැව සංස්ථාවේ කාර්ය මණ්ඩලය ක්‍රියා කළහ. ක්ෂණිකව වෙනස් වන තත්වයන් යටතේ රාජ්‍ය දැව සංස්ථාවෙහි සේවකයින් අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට කටයුතු කළහ. එම තීරණාත්මක කාල පරාසය තුළ ඔවුන්ගේ උපරිම කැපවීමෙන් සහ ඉවසීමෙන් හොඳම සේවාව ලබා දීම ගැන රාජ්‍ය දැව සංස්ථාව වෙනුවෙන් මගේ සියළුම කාර්ය මණ්ඩලයට මම ස්තුතිවන්ත වෙමි. සෑම සේවකයෙකුම තම වගකීම් හොඳින් ඉටු කරන විට අපට සුවිශේෂී ලෙස ඉදිරියට යා හැකි යැයි මම විශ්වාස කරමි. රාජ්‍ය දැව සංස්ථාව, සියළුදෙනාගේම සහයෝගය ඇතිව, වඩාත්ම විශ්වාසදායක සහ හොඳම තත්ත්වයේ දැව සහ දැව පදනම් වූ නිෂ්පාදන සැපයීමේ ජාතියේ නායකයා වීමේ දැක්ම වෙත ගෙන යාමට අප සැවොම උපරිම කැපවීමෙන් කටයුතු කරනු ඇත.

53 වැනි ජයග්‍රාහී වසර වෙත හැරෙමින්

පසුගිය වසර 53 තුළ අපි අපගේ ඉලක්ක සපුරා ගත් අතර ධාරිතා මට්ටම් පුළුල් කළෙමු. දැනට රාජ්‍ය දැව සංස්ථාව ප්‍රාදේශීය කාර්යාල 12ක්, විකුණුම් මධ්‍යස්ථාන 53ක් සහ ගෘහභාණ්ඩ කර්මාන්ත ශාලා 3කින් ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර 9කින් සමන්විත වේ. කෙසේ වෙතත්, රටේ දේශපාලන හා ආර්ථික පසුබිම සමඟ ස්ථාපිත ඉලක්ක වෙත ළඟාවීම සඳහා සෑම කාණ්ඩයකම මෙහෙයුම් කාර්යයන් අභියෝගාත්මක වේ. කෙසේ වෙතත් 2021 සියළු අභියෝගවලට මුහුණ දෙමින් ගෙවන ලද ජයග්‍රාහී වසරකි.

මෙහෙයුම් සමාලෝචනය

වාර්තාකරණ කාලසීමාව තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් සිදු කරන ලද මෙහෙයුම් කටයුතු සමාලෝචනය කිරීම මාගේ වගකීමක් වේ. වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ රාජ්‍ය දැව සංස්ථාව ක්‍රියාත්මක වේ. රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යභාර්යය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ බැඳේ. ඔවුන්ගේ වන කළමනාකරණ සැලැස්මට අනුව හෙළිම් කිරීම සඳහා වෙන් කරන ලද වන වගාවන් වාර්ෂිකව රාජ්‍ය දැව සංස්ථාව වෙත මුදා හරිනි. මුළු රටටම දැව සපයන්නාගේ ප්‍රමුඛයා ලෙස, රාජ්‍ය දැව සංස්ථාව දැව හෙළිමෙන් පසු නිදහස් කරන ලද භූමිය නියමිත වේලාවට නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාරදීමේ වගකීම දරයි.

මීට අමතරව උසාවි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වනජීවී දෙපාර්තුමේන්තුව වැනි රාජ්‍ය ආයතන සතු ඉඩම්වලින් ද සැළකිය යුතු දැව ප්‍රමාණයක් ලබාගැනීමට කටයුතු කරයි. රාජ්‍ය දැව සංස්ථාව විසින් හෙළිම් කරන ලද දැව මෙන්ම පරිත්‍යාග ලෙස ලැබෙන දැව ද අගය එකතු කළ නිෂ්පාදන බවට පත් කරයි. ඒ අනුව කඳන් හැර රාජ්‍ය දැව සංස්ථාවෙන් නිපදවන ප්‍රධාන නිෂ්පාදන වනුයේ ඉරෑ දැව, අලි වැට කණු, වැට කණු, රවුම් කණු, සිල්පර, සම්ප්‍රේෂණ කණු, දර මෙන්ම ගෘහ භාණ්ඩ වැනි බොහෝ අගය එකතු කළ අයිතමයන්ය. මෙසේ රාජ්‍ය දැව සංස්ථාව වසර 53 ක අභිමානවත් ඉතිහාසයක් පසුකර ඇත.

මූල්‍ය වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වන අතර, කළමනාකාරිත්වය තීරණය කරන පරිදි අභ්‍යන්තර පාලනයක් සඳහා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන සැකසීම අවශ්‍ය වේ. මගේ වගකීම වන්නේ මූල්‍ය වත්කම් හා බැරකම් වර්ගීකරණය කර ඇති ආකාරය සහ පැණනගින මූල්‍ය හා කළමනාකරණ අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමයි. නිමා වූ වසරේ ශුද්ධ පිරිවැටුම රු.මිලියන 5,696 ක් වන අතර, බදු සහ බදු ගෙවීමට පෙර උපයා ඇති ලාභය රු.මිලියන 1,496 ක් වන අතර, බදු සහ බදු ගෙවීමෙන් පසු ලාභය රු.මිලියන 1,136 කි. ඉපැයූ ආදායම සහ ලාභය පසුගිය 2020 වසරට වඩා වැඩිය. කෙසේ වෙතත්, අනෙකුත් අගය එකතු කළ දැව නිෂ්පාදනවලට වඩා ඉහළම ආදායම කඳන් විකිණීමෙන් උපයා ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ මෙහෙයුම් පිරිවැය රු.මිලියන 3,594ක් සහ පරිපාලන වියදම් රු. මිලියන 903 අගයක් ගනී.

2020 වසර හා සසඳන විට, 2021 දී පෙර වසරට වඩා ප්‍රගතියක් රාජ්‍ය දැව සංස්ථාව පෙන්නුම් කෙරුණි. නිවැරදි මග පෙන්වීම සහ වෙහෙස මහන්සි වී වැඩ කරන කැපවූ කාර්ය මණ්ඩලය රාජ්‍ය දැව සංස්ථාව සතු බලවත්ම වත්කමක් වන අතර රු. මිලියන 100ක විශාල ආදායමක් බදු ලෙස උපයාදෙමින් භාණ්ඩාගාරය පෝෂණය කිරීමට සමත්විණි.

ඊට අමතරව 2021 වසරේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන කළමනාකරණ සැලැස්මට අනුව හෙළිමට සැලසුම් කර ඇති රුපියල් මිලියන 1,108 ක වටිනාකමකින් යුත් ගස් මෙන්ම වනජීවී දෙපාර්තමේන්තුවෙන් රුපියල් මිලියන 36ක් වටිනා ගස් රාජ්‍ය දැව සංස්ථාව වෙත ලැබිණ. එබැවින් රාජ්‍ය දැව සංස්ථාව විසින් රාජ්‍ය භාගය ලෙස රුපියල් මිලියන 1,144ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලදී. කෙසේ වෙතත්, සහයෝගයෙන් වැඩකරන සහායක කාර්ය මණ්ඩලයක් සිටි බැවින්, කොරෝනා වසංගතයට යටත්වද කැපී පෙනෙන ලාභයක් උපයා ගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට හැකි වූ බව මම ආඩම්බරයෙන් ප්‍රකාශ කරමි.

ජාතියේ විශ්වසනීය නිෂ්පාදන

රාජ්‍ය දැව සංස්ථාව විසින් කඳන්, ඉරෑ දැව, සිල්පර, වැට කණු, විදුලි කණු, අලිවැට කණු මෙන්ම ගෘහ භාණ්ඩ ඉහළම පන්තියේ ගුණාත්මක නිෂ්පාදන සපයයි. රාජ්‍ය දැව සංස්ථාව මේ දක්වා ශ්‍රී ලංකාවේ දැව සැපයුමේ ප්‍රමුඛයා විය. අනෙකුත් දැව කර්මාන්ත සමඟ තරඟ කිරීම විශාල අභියෝගයක් වුවද, උසස් තත්ත්වයේ විශ්වසනීය නිෂ්පාදන ලබා දීමෙන් රාජ්‍ය දැව සංස්ථාව සැමවිටම ජාතීන්ගේ හඳවත් දිනා ගනී. රාජ්‍ය වෙළෙඳ ආයතනයක් ලෙස අපි වැඩිපුරම දැව ලබා දෙන්නේ මොරටුව වඩු කර්මාන්තය සඳහා ය. දුම්රිය දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව සහ ලංකා විදුලිබල මණ්ඩලය අපගේ සිල්පර, අලිවැට කණු, වැට කණු සහ විදුලි කණු මිලදී ගන්නා අපගේ ප්‍රධාන ගැනුම්කරුවන් වේ. තවද රාජ්‍ය දැව සංස්ථාවේ ගුණාත්මක පාරම්පරික ගෘහ භාණ්ඩ තවමත් අපගේ පාරිභෝගිකයින්ගේ විශ්වාසය දිනා ඇත. සුවපහසුව සහ ඇති ගුණාත්මක දැවමය ගෘහ භාණ්ඩ සැපයීම වෙනුවෙන් පාරිභෝගිකයින්ගෙන් ඉහළ ප්‍රතිචාර ලැබිණ. ඒ වගේම රාජ්‍ය දැව සංස්ථාව සෑම විටම ලාභ ඉපැයීමට වඩා හොඳම සේවාවක් පාරිබෝගිකයන් වෙත ලබා දීමට උත්සහ දරයි.



ආයතනික සමාජ මෙහෙවර

ආදායම් ඉපැයීමට එහා ගිය සමාජ මෙහෙවරක් ආයතනික සමාජ ක්‍රියාකාරකම් හරහා සිදු කර ඇත. පර්යේෂණ සංවර්ධන සහ පුහුණු අංශය සෑම විටම ආයතනය සමඟ මෙන්ම සමාජය සමඟ ඇති බැඳීම කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන බැවින් එවැනි කාර්යයන්හි නිරතවේ. 2021 දී පුහුණු වැඩසටහන් සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ, සංවර්ධන හා පුහුණු අංශය විසින් වැය කර ඇති මුළු මුදල රු. 3,045,123/-ක සමස්තයක් වශයෙන් කාර්යමණ්ඩලයේ 690 ක් දේශීය පුහුණු වැඩසටහන් 67 ක් සඳහා ද, සේවා යෝජකයින් 36 දෙනෙකු සඳහා මාර්ගගත විදේශීය පුහුණු වැඩසටහන් 4 ක් සඳහාද සම්බන්ධකර ඇත. තවද රාජ්‍ය දැව සංස්ථාවෙහි පර්යේෂණ සහ පුහුණු අංශය ආයතනයේ වාණිජ්‍ය අවශ්‍යතා මෙන්ම දැව සම්බන්ධයෙන් පැන නගින ගැටළු විසඳීම සඳහා සමාජයට අවශ්‍ය නව දැනුම හා දැව සම්බන්ධයෙන් නිරන්තර පර්යේෂණ සිදු කරයි. 2021 දී ඔවුන් පර්යේෂණ පත්‍රිකා, පොත් පරිච්ඡේද, සඟරා ලිපි ඇතුළුව ලිපි 12ක් පමණ ප්‍රකාශයට පත් කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශයේ එක් ප්‍රධාන කර්තව්‍යයක් වන්නේ දැව හඳුනා ගැනීම, අභ්‍යන්තර පටක කොටස් පරීක්ෂා කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිතා කිරීමයි. දැව සහ ඒවායේ පටක ව්‍යුහය විශ්ලේෂණය කිරීමෙන් දැව හඳුනා ගැනීම සිදුකරයි. මේ යටතේ වාර්ෂිකව දැව හඳුනාගැනීමේ සහතික සහ අනෙකුත් වාර්තා 150-200ක් පමණ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත නිකුත් කෙරේ. දැව හඳුනාගැනීම්වලට අමතරව, MOR, MOE, සම්පීඩන පරීක්ෂණය, ඝනත්ව පරීක්ෂණ, ආතති පරීක්ෂණ, කල්පැවැත්ම සහ පරිරක්ෂණය සඳහා බෝරෝන් පරීක්ෂණය, CCB පරීක්ෂණය, ආදි දැවයේ ශක්ති ලක්ෂණ විශ්ලේෂණය කිරීම සඳහා සිදු කරනු ලැබේ. ඊට අමතරව රාජ්‍ය දැව සංස්ථාව කලාප 14ක් පුරා පැල තවාන් 25ක් පවත්වාගෙන යන අතර වටිනා දැවමය පැල නිෂ්පාදනය කරයි. පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වෙත මෙම පැල නොමිලේ නිකුත් කරනු ලැබේ. ඒ අනුව 2021.12.31 වන විට රටේ වන ගහනය ඉහළ නැංවීමේ අරමුණු කරගනිමින් 2021 වසරේදී පැල 31268ක් පමණ අනෙකුත් ආයතන වෙත නිකුත් කර ඇත.

අනාගත සැලැස්ම

කොවිඩ් 19 හි බලපෑම සහ ව්‍යාපාරික ගැටළුවල මැදිහත්වීම් ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2021 දී ඉතා සිඟිව පහළ බැසීය. මෙය සාමාන්‍යයෙන් පුද්ගලික පරිභෝජනයට බලපෑ අතර, දැව ඇතුළු ඇතැම් අංශ කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. මෙම අභියෝග මධ්‍යයේ වුවද, ආදායම උපරිම කිරීම සඳහා පිරිවැය අඩුකිරීමට මූලපිරීම්, දැව නිෂ්පාදන පරිමාව ඉහල දැමීම කෙරෙහි ඉහළ අවධානයක්, ලබාදීම කාර්යක්ෂම කළමනාකරණ පද්ධතියක් ගොඩනැඟීම, 2020 ව්‍යාපාරික සංකීර්ණතා සැලකීමේදී අප ලබාගත් අත්දැකීම් සහ දැනුම මත සමාලෝචිත වර්ෂය තුල රාජ්‍ය දැව සංස්ථාව වෙත ශක්තිමත් කාර්ය සාධනයක් ලබා දීමට හේතු විය. යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සහ ඉදිකිරීම් නඩත්තුව සඳහා ද අපනයන වෙළෙඳපොළ සඳහා ද අපේක්ෂා කරන භාණ්ඩාගාර අනුමැතිය ඉදිරි ක්‍රියාමාර්ගවලදී සිදු කිරීමට අපේක්ෂිත වේ. ඉදිරියේදී නව සේවකයින් බඳවා ගනිමින් කාර්ය මණ්ඩලය පුළුල් කිරීමෙන් පසු පයිනස් සහ කළුවර ගෘහ භාණ්ඩ අපනයනය කිරීමට බලාපොරොත්තු වේ. එබැවින් නිෂ්පාදන පරාසයන් විවිධාංගිකරණය කිරීම සඳහා අගය එකතු කිරීම් සිදුකර ආයෝජන අවස්ථා වැඩිකරන අතරම, Pinus දැව නිෂ්පාදන සඳහා දේශීය සහ අපනයන වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව දැනටද අවධානය යොමු කරමින් පවතී. දේශීය පයිනස් වෙළඳපොළ සහතික කිරීම සහ පයිනස් දැව අස්වැන්න සඳහා රජයේ වනාන්තර ඉඩම් ඒකාධිකාරය සහතික කිරීම සඳහා අපි දැනටමත් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා ඇත. අනාගත සැලසුම්වලදී ප්‍රධාන වශයෙන් වැඩි ලාභයක් ලබා ගනිමින් ගෘහ භාණ්ඩ අංශය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමුකරයි. නව පයිනස් දැව නිෂ්පාදන සමාජයට ආර්ථික, පාරිසරික සහ සංරක්ෂණ ප්‍රතිලාභ වැඩි දියුණු කරනු ඇත. රාජ්‍ය දැව සංස්ථාව දැව හෙළීමේ ක්‍රමවේද, පදම් කිරීම් හා පරිරක්ෂක ක්‍රමවේද මෙන්ම ගුණාත්මකභාවයෙන් වැඩි නිෂ්පාදන නිපදවීම සඳහා දැව ශ්‍රේණිගත කිරීමේ ක්‍රියා පටිපාටි නව මුහුණුවරකින් වැඩිදියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. Finger Joint ඒකක ද වැඩිදියුණු කිරීමට අවශ්‍ය වන අතර බොහෝ රටවල් එවැනි නිෂ්පාදන සඳහා වැඩි කැමැත්තක් දක්වන බැවින් නුදුරු අනාගතයේ දී Finger Joint නිෂ්පාදන අපනයනය කිරීමට ද උත්සාහ කරනු ඇත. ISO ප්‍රමිති සහතිකය රාජ්‍ය දැව සංස්ථා ගෘහභාණ්ඩ නිෂ්පාදනාගරවලට ලබාගනිමින් රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාවලින් ක්‍රමවත් කරමින් නව අරමුණු සංස්ථාවේ කාර්ය පටිපාටියට එකතු කරමින් අනාගතයේ වෙනස්වන වෙළඳපල පරිසරය සඳහා ගැලපෙන අයුරින් සැලසුම් සකස් කර ඇත.

පිළිගැනීම

සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්ව කණ්ඩායම, මෙන්ම සේවක කාර්යමණ්ඩලය විසින් සාර්ථකත්වය පවත්වා ගැනීම සඳහා කරන ලද කැපවීම පිළිබඳව මාගේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මෙම ගැටළුකාරී තත්වය හමුවේ වුවද අප සමඟ ගනුදෙනු කරන අපගේ වටිනා ගනුදෙනුකරුවන්ට මගේ අවංක කෘතඥතාව පළකරමි. ඔවුන්ගේ ප්‍රමුඛතම දැව සහ දැව මත පදනම් වූ නිෂ්පාදන සැපයුම්කරු තෝරාගැනීම වෙනුවෙන්, ඔවුන්ට අද්විතීය නිෂ්පාදන ලබා දෙමින් අපි අපගේ සේවය උපරිමයෙන් සිදුකිරීමට සැමවිටම සූදානමින් සිටිමු. අවසාන වශයෙන් මාගේ හෘදයාංගම ස්තුතිය වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, ඔහුගේ රාජ්‍ය අමාත්‍යතුමා , අප අමාත්‍යාංශ ලේකම්තුමා ඔහුගේ සහය කාර්ය මණ්ඩලය සහ වන සංරක්ෂක ජනරාල්තුමා ඇතුළු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සමඟ අපගේ අරමුණු සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපට ලබා දුන් නොමසුරු සහයෝගය, 2021 අභියෝගාත්මක වසර සාර්ථක කරගැනීමට පිටුවහලක් වූ බව ප්‍රකාශ කරමි.



ආචාර්ය එන්.ඩී. රුවන්පතිරණ

සාමාන්‍යාධිකාරී (ප්‍ර.වි.නි)
රාජ්‍ය දැව සංස්ථාව.

අපගේ කාර්යභාරයන්

- වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බව පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය ආදී කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

- දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

- දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

- දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

- දැව ආනයනය කිරීම.

- වන වගාවල ව්‍යාපෘති ආරම්භ කිරීම. නැවත වනවගා කිරීම. කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

- කෘෂිකාර්මික නිෂ්පාදන

- දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

- පෞද්ගලික ඉඩම්වලින් දැව මිලදීගැනීම.

- වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම.

- වේවැල් ආනයනය කිරීම.

- නියැදි පරීක්ෂා කිරීම් මඟින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනාගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.

- දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

- සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැළසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

අපගේ ව්‍යාපාරික වටිනාකම්

- ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් පීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.

- පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමනාකරණයට සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටුකිරීමට අපි කැපවෙමු.

- ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියලුම ශ්‍රී ලාංකිකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලිකම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.

- කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.

- ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියලු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.

- සියලුම මෙහෙයුම් කටයුතුවලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබාගන්නා බවට සහතික වන්නෙමු.

- අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියලුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලය - 2021



උදය සී. වලිසිංහ මහතා

සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

බියංකා එන්. ගමගේ මහත්මිය

අධ්‍යක්ෂ
භාණ්ඩාගාර නියෝජිත

ආචාර්ය කේ.එම්.ඒ. බණ්ඩාර මහතා

අධ්‍යක්ෂ
වන සංරක්ෂක ජනරාල්

බී.ඒ. ධර්මරත්න මහතා

අධ්‍යක්ෂ

බී.ඩී. ගුණතිලක මහතා

අධ්‍යක්ෂ

එච්.කේ.එම්.ජේ.එච්. කුමාරසිංහ මහතා

අධ්‍යක්ෂ

ජී. කපිල ප්‍රසන්න මහතා

අධ්‍යක්ෂ

එම්.ජී. දිලානි ශාරිකා මිය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඩුල්ල - 2021



ජී.ඩී.එස්.කුමාරසිංහ මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
- මුදල්

එම්.ඒ.සී.එන්. සමරසිංහ මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
- මානව සම්පත් හා පාලන

එම්.සී. දේවේන්ද්‍ර මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
- මෙහෙයුම්

ඩබ්.බී. සමන්ත මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
- අලෙවි

ජී.ජී.තිසර ගමගේ මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
- ඉංජිනේරු හා නිෂ්පාදන (වැ.ආ)

2021 වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාවෙහි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා අපගේ වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස අප සතුටට පත්වන්නෙමු.

හැඳින්වීම

රාජ්‍ය දැව සංස්ථාව 1968 දී අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද රාජ්‍ය ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය "සම්පත්පාය" බත්තරමුල්ල හි පිහිටා ඇති අතර, ප්‍රාදේශීය කාර්යාල දිවයින පුරා පිහිටා ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම්

රාජ්‍ය දැව සංස්ථාව මූලික වශයෙන් තම ආදායම් උපයාගනු ලබන්නේ දැව හා දැව පදනම් කරගත් නිෂ්පාදන අලෙවියෙනි.

ව්‍යාපාර සමාලෝචනය

කොවිඩ්-19 වසංගතය 2020 වර්ෂයේ ව්‍යාපාර කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී. මේ අනුව 2020 මූල්‍ය වර්ෂය රාජ්‍ය දැව සංස්ථාවට ද අතිශයින්ම අභියෝගාත්මක වූ අතර, එහි බලපෑම අඛණ්ඩව මේ වසරේදී ද අත්විඳීමට සිදුව ඇත.

අගය උපරිම කිරීම සඳහා පිරිවැය ප්‍රශස්තිකරණය, පරිමාව මත පදනම් වූ වර්ධනය කෙරෙහි ඉහළ අවධානයක් යොමුකිරීම, ප්‍රවසම්පන්න කළමනාකරණය ඇතුළු 2020 වර්ෂයේදී මුහුණ පෑමට සිදුවූ ව්‍යාපාරික ගැටළු සඳහා විසඳුම් සෙවීමේදී අප ලබාගත් අත්දැකීම් සහ දැනුම උපයෝජනය කර ගැනීමෙන් කොවිඩ්-19 තුළින් පැණනැඟුනු අභියෝග නොතකා, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශක්තිමත් කාර්ය සාධනයක් ළඟාකරගැනීමට රාජ්‍ය දැව සංස්ථාව සමත් විය.

මූල්‍ය කාර්ය සාධනය

කොවිඩ්-19 හි බලපෑම, පාරිභෝගික හැසිරීම මත සහ අපගේ ඇතැම් නිෂ්පාදන කාණ්ඩවල ක්‍රියාකාරිත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළේය. රාජ්‍ය දැව සංස්ථාව විසින් 2021 වර්ෂයේ ආදායම ලෙස රුපියල් මිලියන 5,696 ක් උපයා ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 43% ක ඉහළයෑමකි. එමෙන්ම, සංස්ථාව විසින් 2021 වර්ෂය සඳහා උපයා ඇති දළ ලාභය රුපියල් මිලියන 2,754 ක් වන අතර, එය පෙර වසරට සාපේක්ෂව 58% ක ඉහළයෑමකි.

කාර්ය සාධනය	2021	2020
	රු.මිලි	රු.මිලි
පිරිවැටුම	5,696	3,981
දළ ලාභය	2,754	1,746
මෙහෙයුම් ලාභය	1,245	369
මෙහෙයුම් නොවන ආදායම්	252	200
භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පෙර ලාභය	1,496	569

පිරිවැටුම



දළ ලාභය



බදුවලට පෙර ශුද්ධ ලාභය



සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව විසින් රුපියල් මිලියන 1,496 ක බදු පෙර ශුද්ධ ලාභය වාර්තා කළ අතර, එය පෙර වර්ෂයට සාපේක්ෂව 163%ක වර්ධනයකි. අගය උපරිම කිරීම සඳහා පිරිවැය ප්‍රශස්ත කළමනාකරණය, පරිමාව කෙරෙහි ඉහළ අවධානය හා සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම මෙම වර්ධනය ළඟාකර ගැනීමට ඉහළ දායකත්වයක් ලබාදී ඇත.

රැකියා අවස්ථා ලබාදීම තුළින් ශ්‍රී ලංකාවේ විරැකියාව තවදුරටත් අඩුකිරීම සඳහා රජයට සහයවීම හා වෙළෙඳ පොළට ගුණාත්මක නිෂ්පාදන සැපයීම රජයේ ආයතනයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථාවෙහි වගකීමක් වශයෙන් අප සළකනු ලබයි. 2021 වර්ෂයේ අභියෝගාත්මක ආර්ථික පරිසරයක් යටතේ වුවද, සංස්ථා සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාව තහවුරු කරමින් සේවක පිරිවැය ලෙස රුපියල් මිලියන 1,581 ක් වැයකර ඇත. 2021 වර්ෂයේ මුළු සේවක සංඛ්‍යාව 1,606 ද 2020 වර්ෂයේ දී 1,708 ක් ද විය.

2020 හා 2021 වර්ෂ සඳහා වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම මත ප්‍රතිලාභ පහත පරිදි වේ.

කාර්ය සාධනය	වත්කම් මත ප්‍රතිලාභ	ස්කන්ධය මත ඉපැයීම්
2021	13%	18%
2020	6%	8%

2020 වර්ෂයේ දී 6% ක් වූ බදු ගෙවීමට පෙර සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ 2021 වර්ෂයේ දී 13% දක්වා සිට ඉහළ ගිය අතර, 2020 වර්ෂයේ දී 8% වූ ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) 2021 වර්ෂයේදී ද 18% දක්වා ඉහළ නැගුණි. කොවිඩ්-19 ලෝක වසංගත තත්වය හමුවේ වුවද සමාලෝචනයට භාජනය වූ වර්ෂයෙහි රජයේ ආදායමට සංස්ථාවේ දායකත්වය රුපියල් මිලියන 1,373 වන අතර, භාණ්ඩාගාරයට ගෙවන ලද රු.මිලියන 100 ක බදුද එයට ඇතුළත් වේ.

නිෂ්පාදනය

මෙහෙයුම් ක්‍රියාවලිය පරිසර හිතකාමී වීම ගුණාත්මක ඉහළ නිෂ්පාදන මට්ටමක් පවත්වාගැනීම සඳහා මෙන් ම ආයතනයේ පැවැත්මට සහ ලාභදායිතාවයට මෙන් ම ආයතනික අභ්‍යන්තර හා බාහිර සංරචකවල යහපැවැත්මට අත්‍යවශ්‍ය බව සංස්ථාව තරයේ විශ්වාස කරයි.

රජය විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟතාවය දක්වමින් ඒවාට අනුකූලව කටයුතු කිරීම, ක්‍රමවත් වැඩබිම් වර්ගීකරණ ලැයිස්තුවක් සකස් කිරීම, විද්‍යාත්මක දැව නිස්සාරණය, නිවැරදි දැව පරිරක්ෂණ ක්‍රම භාවිතය, විධිමත් අයුරින් යන්ත්‍රෝපකරණ ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම, සේවකයින් බඳවාගැනීමේ සහ සංවර්ධනය කිරීමේ නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීම, සංස්ථාවේ කෙටි හා දිගුකාලීන අරමුණු තිරසාර ආකාරයකින් ඉටුකර ගැනීමට ඉවහල් විය. සැබවින් ම රාජ්‍ය දැව සංස්ථාව යනු ශ්‍රී ලංකාවේ තිරසාර වන කළමනාකරණය සඳහා දායකත්වය සපයන ප්‍රධාන ආයතනයයි.

ඊට අමතරව කර්මාන්තයේ ප්‍රතිවාදීන්ට වඩා තරඟකාරීව වාසි ලබාගැනීම සඳහා පහත සඳහන් උපයා මාර්ග ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය දැව සංස්ථාව අදහස් කර ඇත.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරනු ලබන වනවගා විද්‍යාත්මක දැව නිස්සාරණය කිරීම සඳහා කටයුතු කිරීම.
- වෙළෙඳපොළ සඳහා කඳන්, දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සිල්පර, විදුලිබල මණ්ඩලය සඳහා විදුලිකණු හා වනජීවී දෙපාර්තමේන්තුව සඳහා අලිවැටකණු මෙන්ම පාරිභෝගික ඉල්ලුම සපුරාලීම සඳහා ඉරුදැව නිෂ්පාදනය කිරීම.
- වාණිජ වටිනාකමින් යුතු දැව රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් හා පෞද්ගලික ඉඩම්වලින් මිලදීගැනීම.
- පරිත්‍යාග හා වනඅපරාධ දැව ලබාගැනීම.
- වනවගා වැඩසටහන් සඳහා ක්‍රියාකාරිත්ව සහභාගිවීම. (ක්‍රියාකිරීම හා සහභාගීවීම)
- දුම්රිය සිල්පර ආනයනය කර අගයක් එකතු කිරීමෙන් අනතුරුව ප්‍රති අපනයනය කිරීම.

රජයේ කැළෑවලින් දැව හෙළීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මුදාහරින ලද පරිණත වනවගාවන් හි ප්‍රමාණය අඩුවීම මෑතකදී අපට මුහුණදීමට සිදු වූ ප්‍රධාන බාධකයකි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව නිදහස් කරන වනවගා ප්‍රමාණය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අමතර ප්‍රමාණයක් නිදහස් කරගැනීමත්, රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සිල්පර සහ විදුලි සම්ප්‍රේෂණ කණු සඳහා අවශ්‍ය දැව ලබාගැනීමත්, ශ්‍රී ලංකා දුම්රිය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාවට අයත් ඉඩම්වලින් දැව ලබාගැනීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙළීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වන වගා නිදහස් කරනු ලබන අතර 2021 හා 2020 වර්ෂවල හෙළීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

දැව විශේෂය	පූර්ණ හෙළීම් (හෙක්ටයාර්)		තුනීකිරීම් (හෙක්ටයාර්)	
	2021	2020	2021	2020
තේක්ක	541	692	490	132
යුකැලිප්ටස්	160	51	238	296
පයිනස්	265	109	-	-
කායා	-	-	244	24
ඇකේෂියා	35	8	-	-

ඉරුෑ දැව බවට පරිවර්තනය කිරීම

2021 වර්ෂයේ ඉරුෑදැව නිෂ්පාදනය ඝන මීටර් 3,924 ට සාපේක්ෂව 2020 වර්ෂය තුළදී ඉරුෑදැව ඝන මීටර් 3,387 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 3,137 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

විදුලි කණු සහ සිල්පර පරිරක්ෂණය කිරීම

2021 වර්ෂය තුලදී සිල්පර 29,049ක් හා අලිවැටකණු 11,913ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බූස්ස පරිරක්ෂණාගාරවලින් පරිරක්ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්ෂව සිල්පර නිෂ්පාදනය 24%කින් ඉහළ ගොස් ඇත.

ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරවලින් රුපියල් මිලියන 389 ක් වටිනා ගෘහභාණ්ඩ සළකාබලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත. ඒ අතර රුපියල් මිලියන 390 (බදු සහිත) ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, නුවර, රත්නපුර, තලල්ල, බූස්ස, අම්පාර, බණ්ඩාරවෙල හා බත්තරමුල්ල ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත.

2020 - 2021 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

		නිෂ්පාදන ප්‍රමාණය		අලෙවි ප්‍රමාණය		දළ පිරිවැටුම	
		2021	2020	2021	2020	2021(රු.මිලි)	2020 (රු.මිලි)
කඳුන්	ඝ.මී	127,698	106,609	141,556	103,955	4,929	3,299
ඉරුඳැව	ඒකක	3,924	3,387	3,137	2,279	309	222
සිල්පර	ඒකක	29,049	38,380	29,002	36,552	287	371
විදුලි කණු	ඒකක	2,624	-	2,729	2,287	30	24
අලිවැට කණු	ඒකක	11,913	9,171	17,412	9,347	104	48
වට කණු	ඒකක	97,846	67,589	101,880	76,761	12	9
දර	ඝ.මී	86,971	82,856	70,075	60,171	49	40
වැට කණු	ඒකක	151,893	105,453	164,913	117,430	22	19
ගෘහභාණ්ඩ	රු.මිලි	389	233			390	237

ඉලක්ක හා ළඟාකරගැනීම් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය

රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්ව මඩුල්ල විසින් දෛනික මෙහෙයුම් කටයුතු වසර ආරම්භයේ ස්ථාපනය කරන ලද අරමුණුවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා හා අරමුණු සහ ඉලක්ක වසර අවසානයේ දී ළඟාකර ගැනීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ලබයි. ඒ අනුව ප්‍රගතිය අධීක්ෂණය කිරීම ඇතුළු එක් එක් කලාපයට අදාළව පවත්නා හා ඇති විය හැකි සියලු ගැටළු විසඳීම සඳහා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගිත්වයෙන් මාසික ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ රැස්වීමක් රාජ්‍ය දැව සංස්ථාවෙහි කළමනාකාරිත්වය විසින් පවත්වනු ලබයි.

ශ්‍රී ලංකාව මේ වනවිට කොවිඩ්-19 රෝගීන්ගේ වැඩිවීමක් අත්විඳිමින් සිටී. වසංගතයේ සෘණාත්මක බලපෑම් වලින් ඔබ්බට ගොස් අප ජාතිය නැවත ගොඩනැඟීමට සහායවීමට ආයතනයක් වශයෙන් අප විසින් දරන උත්සාහය මත අපගේ ආයතනික අරමුණ පෙර වර්ෂවලට වඩා අදාළ වී තිබේ. අපගේ ප්‍රජාව කෙරෙහි අපගේ වගකීම අප වටහාගෙන ඇති අතර, අපගේ පාර්ශවකරුවන් හට ඉහළ වටිනාකම් ලබාදෙමින් ඔවුන් සමඟ ඉදිරියට යාමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට.



උදය සී වලිසිංහ

සභාපති
රාජ්‍ය දැව සංස්ථාව

අපගේ ආවරණ කලාප

ස්ථාන සිතියම - රාජ්‍ය දැව සංස්ථාව




Monaragala Region
38 Kumbukana Depot (F13)
39 Wellawaya Depot (E13)
Nuwara Eliya Region
40 Nuwara Eliya Depot (D12)
41 Kitulgala Depot (C12)
42 Harasbedda Depot (D12)
Polonnaruwa Region
43 Kaduruwella Depot (E06)
44 Wilankulama (Trincomalee) (E06)
45 Minneriya Depot (E08)
Rathnapura Region
46 Dela Depot (C13)
47 Beruwala Depot (A14)
48 Timbolketiya Depot (D14)
49 Matugama Depot (B14)
Boossa Region
50 Boosa Depot (B15)
Keppetipola Region
51 Keppitipola Depot (D12)
Furniture Showrooms
1 Head Office - Battaramulla (A12)
2 Rathmalana (A13)
3 Boossa (B15)
4 Pallekele (D11)
5 Ampara (G11)
6 Rathnapura (C13)
7 Talalla (D16)
Furniture Factories
1 Ampara (G11)
2 Kaldemulla (A13)
3 Boossa (B15)
Circuit Bungalows
1 Nuwara Eliya - Kandapola (D12)
2 Nuwara Eliya - Kandapola (New) (D12)
3 Timbolketiya (D14)
4 Sella Kataragama (F14)
Training Centers
1 Kaldemulla - TTTI (A13)
2 Head Office - IT (A12)
Laboratories
1 Head Office (A12)
Mechanical Workshops
1 Kaldemulla (A13)
2 Boralanda (E13)
3 Keppetipola (D12)
Sawmills
1 Kaldemulla (A13)
2 Boossa (B15)
3 Ampara (G11)
4 Keppetipola (D12)
5 Talalla (D16)
6 Ethgala (C11)
7 Dela (C13)
8 Melsiripura (C10)
Seasoning and Impregnation Plant
1 Kaldemulla (A13)
2 Boossa (B15)
3 Keppetipola (D12)
Kaduruwela
Dambulu Oya
Nikaweratiya
Batticaloa
Naula (Medapihilla)
Melsiripura
Bingiriya
Kurunegala
Matale
Kankaniyamull
Padiyathalawa
Nainamadama
Kandy (Pallekele)
Ampara
Mirigama
Nelundeniya
Ethgala
Harasbedda
Kadawatha
Kithulgala
Nuwara Eliya
Kandapola
Battaramulla
Keppetipola
Pannipitiya
Bandarawela
Monaragala
Boralanda
Kumbukkana
Rathnapura
Wellawaya
Dela
Dehiwala
Rathmalana
Moratumulla
Matugama
Colombo
Beruwala
Willorawatta
Sella Katharagama
Timbolketiya
Kaldemulla
Egoda Uyana
Ambalangoda
Hambanthota
Panadura
Boossa
Unawatuna
Matara
Talalla
A
B
C
D
E
F
G
H
2019-09









ආයතනික පාලනය

රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලනයෙහි (Corporate governance) ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙනයාමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැපවී සිටින අතර, එහි වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

පාර්ශවකරුවන් සඳහා වන වගකීම් වෙත අවධානය යොමුකර ඇති බව සහතික කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව තුළ ආයතනික පාලන ප්‍රතිපත්ති සහ භාවිතයන් සැළසුම් කර ඇති අතර, එමගින් සංස්ථා සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින් සහ එය ක්‍රියාත්මක වන සියලුම ප්‍රජාවන් ඇතුළු එහි සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගනී. මෙම ලිපිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ආයතනික පාලන ප්‍රතිපත්ති, භාවිතයන් සහ ක්‍රියාවලින් පිළිබඳ පැහැදිළි කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි මෙහෙයුම්

අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංස්ථාව පාලනය කරනු ලබන අතර, සංස්ථාවේ ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සහ අධීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂකවරුන් හත් දෙනෙකුගෙන් සැදුම්ලත් අතර, ඉන් අධ්‍යක්ෂකවරුන් පස් දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන අතර, අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නිල වශයෙන් පත්කරනු ලබන්නේ ඔවුන්ගේ ස්වාධීනත්වය හා විශේෂඥ දැනුම පදනම් කරගෙන වන අතර, නිල වශයෙන් පත්කරන ලද අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂවරයෙකු මුදල් අමාත්‍යාංශයෙන් පත්කරනු ලබයි.

සෑම රැස්වීමකටම පෙර, තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් හට අදාල සියලුම කළමනාකරණ තොරතුරු සහ පසුබිම් තොරතුරු සපයනු ලැබේ. සංස්ථාවේ කාර්යසාධනය, නව ආයෝජන, ප්‍රාග්ධන ව්‍යාපෘති සහ නිශ්චිත මණ්ඩල අනුමැතිය අවශ්‍ය වන වෙනත් ගැටළු පිළිබඳව මණ්ඩල පත්‍රිකා රැස්වීමට පෙර ඉදිරිපත් කරනු ලැබේ.

සංස්ථාවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ බාහිර පාර්ශවකරුවන් සමඟ නිරන්තර සම්බන්ධතා පැවැත්වීම, ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් සභාපතිවරයා වගකිව යුතුය. තවද, සංස්ථාවේ සමස්ථ වාණිජ, මෙහෙයුම් හා උපායමාර්ගික සංවර්ධනයේ සියලු අංශ සඳහා ඔහු වගකිව යුතු අතර, ඒ සඳහා අනෙකුත් අධ්‍යක්ෂකවරුන් සහ ඉහළ කළමනාකාරිත්වයේ සහාය ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී තම අංශයට අදාල කරුණු සාකච්ඡා කරන විට ඉහළ කළමනාකාරිත්වයේ සාමාජිකයන් රැස්වීම අතරතුර අදාල අවස්ථාවේ පෙනී සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

- සංස්ථාවේ ව්‍යාපාර සහ කටයුතු මෙහෙයවීම
- සංස්ථාවේ මෙහෙයුම් සැළසුම් සඳහා පදනමක් ලෙස කෙටිකාලීන හා දිගුකාලීන උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- ව්‍යාපාරයේ ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක බව සහතික කිරීම.
- අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික වීම.
- වාර්ෂික ප්‍රාග්ධනය සහ මෙහෙයුම් අයවැය අනුමත කිරීම සහ අයවැයට එරෙහිව කාර්යසාධනය සමාලෝචනය කිරීම.
- සංස්ථාවේ අවසාන මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම.
- නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සහතිකවීම.
- සියලුම ගිවිසුම්, අත්පත්කර ගැනීම් හෝ වත්කම් බැහැර කිරීම සහ ප්‍රාග්ධන ව්‍යාපෘති අනුමත කිරීම.
- භාණ්ඩාගාරයෙන් පත්කරන ලද අධ්‍යක්ෂවරයා සංස්ථාව සමඟ සෘජු හෝ වක්‍ර ද්‍රව්‍යමය සබඳතාවක් නොමැතිව ස්වාධීන වන අතර, එම අධ්‍යක්ෂකවරයා සතු පුළුල් පරාසයක විශේෂඥ දැනුම සහ වාණිජ ආයතනික සහ මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ සැළකිය යුතු අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන දැක්මක් සහ විනිශ්චයක් ගෙන එයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටු

සියලුම අනු කමිටු පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම, මෙම කමිටු සඳහා සාමාජිකයින් පත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම අනු කමිටු සඳහා වගකීම් පවරා ඇත.

විගණන කමිටුව

විගණන කමිටුව අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, එම අධ්‍යක්ෂකවරුන් බී.එන්.ගමගේ මහත්මිය - කමිටු සභාපතිනි, එච්.කේ.එම්.ජේ.එච් කුමාරසිංහ මහතා - කමිටු සාමාජික සහ - කේ.ප්‍රසන්න මහතා - කමිටු සාමාජික වේ. සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ ප්‍රධානීන් අවශ්‍ය අවස්ථාවේදී විගණන කමිටු රැසිවීම් සඳහා සහභාගී වේ. පිටු අංක 31 හි විගණන කමිටු වාර්තාව, මූල්‍ය වර්ෂය තුළ කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් පැහැදිලි කරනු ලබයි.

අභ්‍යන්තර පාලන - Internal Controls

සංස්ථාවෙහි වත්කම් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ විශ්වාසදායක තොරතුරු ජනනය වන, නිවැරදි හා සම්පූර්ණ වාර්තා පවත්වාගෙනයාම සහතික කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. මෙම පද්ධතියට මූල්‍ය, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය ඇතුළු සියලුම පාලයන් ඇතුළත් වන අතර, අවදානම් කළමනාකරණය සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද උපාය මාර්ග පිටු අංක 33 සිට 37 දක්වා අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත.

අවුරුදු 05ක කාලසීමාවක් ආවරණය වන උපාය මාර්ගික සැළසුම්වලට අමතරව, සෑම මූල්‍ය වර්ෂයක් ආරම්භයේදීම පුළුල් අයවැය ක්‍රියාවලියක් ක්‍රියාත්මකවේ. වාර්ෂික අයවැය, තීරණාත්මක සාර්ථක සාධක හඳුනාගැනීම මගින් සියලු අංශ විසින් සකස් කරන ලද ක්‍රියාකාරී අරමුණු, මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර, සෑම මසකම එහි ප්‍රගතිය පරීක්ෂා කරනු ලබයි.

සංස්ථාවෙහි අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය නිතිපතා ඇගයීමට ලක්කරන අතර, එහි සොයාගැනීම් විගණන කමිටුව විසින් පළමුව සමාලෝචනය කරනු ලබන අතර, ඉන්පසුව සැළකිය යුතු ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය දැනට පවතින අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි සමාලෝචනය කරන ලද අතර, එහි සඵලතාවය පිළිබඳව තෘප්තිමත්වේ.

පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතාවය

අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ යහපත් සබඳතාවක් පවත්වා ගැනීමේ ඇති වැදගත්කම හඳුනාගන්නා අතර, සමස්ථ සංස්ථාව තුළම මෙය ඇති කිරීම සහතික කරයි. සංස්ථාව තුළ අභ්‍යන්තර සන්නිවේදනය ප්‍රධාන වශයෙන් විද්‍යුත් තැපෑල, සංදේශ සහ චක්‍රලේඛ හරහා සිදුකෙරේ.

සංස්ථාවේ ප්‍රතිපත්ති සහ භාවිතයන් සංස්ථාවේ වටිනාකම් සහ එහි සමාජ වගකීම්වලට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරනු ලබන අතර, සංස්ථාව තම සේවකයින්ගේ සහ සංවිධානය තුළ සිටින අනෙකුත් අයගේ පරිසරය, සෞඛ්‍ය සහ ආරක්ෂණ ප්‍රමිතීන් ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කරයි. අදාල ක්‍රියාමාර්ග ආයතනික සමාජ වගකීම් වාර්තාවේ 38 සිට 45 දක්වා විස්තරාත්මකව දක්වා ඇත.

අනුකූලතාවය - Compliance

රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් අභ්‍යන්තර අනුකූලතා ක්‍රියාපටිපාටි කෙරෙහි සැළකිය යුතු අවධාරණයක් ලබාදෙනු ඇති අතර, අනුකූලතාවය සහතික කිරීම සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS සහ SLFRS) සහ අනෙකුත් ව්‍යවස්ථාපිත රෙගුලාසිවල මාර්ගෝපදේශවලට අනුකූලව සකස් කර ඇත.

පැවැත්ම - Going Concern

සංස්ථාවේ මූල්‍ය තත්වය සහ මුදල් ප්‍රවාහ තත්වය මනාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී "Going Concern" පදනම අඛණ්ඩව භාවිතා කර ඇත, සංස්ථාවේ ඉදිරි කාලය සඳහා එහි ක්‍රියාකාරිත්වය අඛණ්ඩව කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි විශ්වාසය වේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව - 2021

විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

බියන්කා එන්.ගමගේ මිය - **සභාපතිනි**

එච්.කේ.එම්.ජේ.එච්.කුමාරසිංහ මහතා - **සාමාජික**

ජී.කපිල ප්‍රසන්න මහතා - **සාමාජික**

2021 වර්ෂයේ දී අවධානය යොමු කළ අංශ



මූල්‍ය වාර්තාකරණය



අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලන



බාහිර විගණනය



අනුකූලතාවය

කමිටු අරමුණු

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ වගකීම ඉටුකිරීමට සහයවීම මූලික කරගත්, මූල්‍ය ප්‍රකාශවල නිවැරදි බව, නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීම සහතික කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලිය, අභ්‍යන්තර පාලන ක්‍රමය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අභ්‍යන්තර විගණන කාර්යය හා සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමේ අරමුණින් බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම යන කාර්යයන් ඉටුකිරීම සඳහා විගණන කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.

ව්‍යාපාරික පරිසරය තුළ මතුවෙමින් පවතින නව ප්‍රවණතා සමඟ ගමන්කිරීම සහ කමිටුවේ වගකීම් නියමිත වේලාවට හා නිසි අයුරින් ඉටුකිරීම සහතික කිරීම දක්වා විගණන කළමනාකරණ කමිටුවෙහි කාර්යභාරය සහ වගකීම් අඛණ්ඩව විකාශනය වේ.

ප්‍රධාන වගකීම්

- මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අනුගමනය කර ඇති පාලනයන් සමාලෝචනය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අනාවරණය කිරීම්වල ප්‍රමාණවත් බව සහතික කිරීම.
- සංස්ථාවේ වත්කම්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ අවදානම් කළමනාකරණ කාර්යයේ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය අධීක්ෂණය සහ සමාලෝචනය.
- විගණන කමිටුව අනුමත ආවරණ සැළැස්ම ක්‍රියාත්මක කිරීම ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතු අධීක්ෂණය කිරීම.
- බාහිර විගණකවරුන්ගේ ස්වාධීනත්වය සහ කාර්යසාධනය තක්සේරු කිරීම.
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයෙන් පැණනගින සොයාගැනීම් සළකාබැලීම.
- ඒකාබද්ධ වාර්තාව, විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ අතුරු වාර්තාව අනුමත කිරීම මණ්ඩලයට නිර්දේශ කිරීම.

2021 වර්ෂයේ දී සිදුකරන ලද කාර්යයන්

විගණන කමිටුව 2021 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

01. මූල්‍ය වාර්තාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර කමිටුව අවසාන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර කළමනාකරණය සමඟ සාකච්ඡා කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා භාවිතා කරන තොරතුරු පද්ධතිවල අදාළ පාලනයන්වල ඵලදායීතාවය සහ අවදානම් පිළිබඳව කමිටුව විසින් අඛණ්ඩව අවධානය යොමුකරන ලදී.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති විය හැකි මූල්‍යමය බලපෑම සළකාබලා කමිටුව විසින් නිතිපතා ව්‍යාපාරයේ පැවැත්ම පිළිබඳ ඇගයීම් සිදුකරන ලදී. තවද, වර්ෂය තුළදී කමිටුව නිරන්තරයෙන් මූදල් ප්‍රවාහ ප්‍රකාශන සහ අරමුදල් සම්පාදනය සමාලෝචනය කරන ලදී.

02. අනුකූලතාවය

නියාමන හා නෛතික අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාපිත බදු අනුකූලතාව ප්‍රකාශ ඇතුළු නියාමන හා අනුකූලතා ප්‍රකාශ විගණන කමිටුව සමාලෝචනය කරන ලදී.

03. අභ්‍යන්තර විගණනය, අවදානම් සහ පාලන

සංස්ථාවට බලපාන සියලු ආකාරයේ වැදගත් අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීම සඳහා ඵලදායී උපාය මාර්ග ක්‍රියාත්මක වන බවට කළමනාකාරිත්වයෙන් අවශ්‍ය සහතිකය ලබාගැනීම කෙරෙහි කමිටුව අඛණ්ඩව අවධානය යොමු කර ඇත. වර්ෂය තුළදී අවදානම් හඳුනාගැනීම, ඇගයීම, අවම කිරීම හා පාලන දුර්වලතා සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද ප්‍රධාන අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳව සංස්ථාවෙහි කළමනාකාරිත්වය සමඟ කමිටුව සාකච්ඡා කරන ලදී.

සංස්ථාව තුළ අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය පිළිබඳව කමිටුව නිරන්තරයෙන් විමර්ශනය කරන ලදී. පවත්වන ලද අභ්‍යන්තර විගණනයන්හි යාවත්කාලීන කිරීම් ද මෙහි සමන්විත වේ. තවද, මෙම ක්‍රියාවලියට සංස්ථාවේ ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලට අනුකූලවීම සහ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම පිළිබඳ යාවත්කාලීන කිරීමක් ඇතුළත් වේ.

සංස්ථාව සඳහා වන අභ්‍යන්තර විගණන සැළැස්ම නියමිත කාල පරතරයන් තුළ කමිටුව විසින් සමාලෝචනය කළ අතර, මෙහෙයුම් පරිසරයට සහ ව්‍යාපාරික අවශ්‍යතාවන්ට සරිලන පරිදි වෙනස්කම් සිදුකරන ලදී.

04. බාහිර විගණනය

කමිටුව බාහිර විගණකවරුන් නිරන්තරයෙන් මුණගැසී ඔවුන්ගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය සිදුකළේය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් බාහිර විගණකවරුන් සමඟ රැස්වීම් පවත්වා ඇති අතර, විගණනය සැළසුම් කිරීමේ හා විෂයපථයේ සැළසුම් කරනු ලබන අදියරේදී විගණන සැළැස්ම සමාලෝචනය කිරීම, මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර විගණනය අවසන් කිරීම පිළිබඳ විගණන වාර්තාව සහ අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කළ යුතු අංශ සහ විගණකවරුන්ගේ මතය අනුව කළමනාකරණයේ අවධානය යොමු කළ යුතු වෙනත් කරුණු පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී. තවද, විගණන කළමනාකරණ කමිටුව විසින් බාහිර විගණකවරුන් සමඟ යම් නිශ්චිත කරුණු සාකච්ඡා කිරීම සඳහා ද, සාකච්ඡා පැවැත්විය. විගණන කමිටුව විසින් ඉහළ කළමනාකාරිත්වයේ තොරතුරු ද සැළකිල්ලට ගනිමින් බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය සමාලෝචනය කළ අතර, සමාලෝචන ප්‍රතිඵල බාහිර විගණකවරුන් හා කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කළේය.

බී.එන්.ගමගේ

සභාපතිනි
විගණන හා කළමනාකරණ කමිටුව.

අවදානම් කළමනාකරණය

තිරසාර වර්ධනයක් මෙන්ම ආයතනික අරමුණු හා පරමාර්ථ ළඟා කරගැනීමෙහි ස්ථාවර ප්‍රගතියක් ලබාගැනීම සඳහා ව්‍යාපාර සහ මූල්‍ය අවදානම් කළමනාකරණය මූලික වශයෙන් වැදගත් වේ. "අවදානම" සහමුළුමනින් ම "තුරන් කිරීමට" නොහැකි සාධකයක් වන අතර, මෙහෙයුම් අඛණ්ඩව සමාලෝචනය හා උපාය මාර්ග අනුගමනය කරමින් අවදානම් "අවම කිරීම" සංස්ථාව සහතික කරයි. මෙම ඉලක්කය සපුරාගැනීම සඳහා විවිධ උපාය මාර්ග සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

අවදානම් පරිසරය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2021 මූල්‍ය වර්ෂය ඉතා අභියෝගාත්මක වසරක් විය. කෙසේ වෙතත්, ක්‍රියාශීලී නායකත්වය සහ දැව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම තුළින් මෙම අවිනිශ්චිතතාවයන් මඟහරවා අපගේ මූලික ව්‍යාපාරය සමඟ ශක්තිමත් ලෙස වර්ධනය විය හැකි බව අපගේ විශ්වාසයයි. තවද, විවිධාංගීකරණය වූ කර්මාන්තයක සිටීම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ දී සංස්ථාවට ශක්තියක් වූ අතර, ආර්ථික අවපාත පසුබිම තුළ වුවද ස්ථාවර ප්‍රකෘතියක් ලබාගත්තෙමු.

අවදානම් පාලනය

අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වන අතර, අවදානම් කළමනාකරණය පිළිබඳ අධීක්ෂණ වගකීම ඇති විගණන කමිටුව විසින් මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය සහය ලබාදේ. අවදානම් හඳුනාගැනීම, මැනීම, කළමනාකරණය අවම කිරීම සහ අවදානම් අධීක්ෂණය මෙන්ම අභ්‍යන්තර විගණනයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් වාර්තා කිරීමට සෑම අංශ ප්‍රධානියෙකුම වගකීමෙන් බැඳී සිටී.

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

රාජ්‍ය දැව සංස්ථාවෙහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සියලුම ආකාරයේ ව්‍යාපාරික හා මූල්‍ය අවදානම් මැනවින් හඳුනාගැනීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සහතික වන පරිදි සකස් කර ඇත. මෙය ව්‍යුහාත්මක අවදානම් පාලන ක්‍රමවේදයකට පහසුකම් සපයන අතර, ව්‍යාපාරයේ සෑම අංශයකම අවදානම් ඇතිවීමට පෙර හඳුනාගත හැකි සංස්කෘතියක් (Risk aware culture) ඇති කරමින් ප්‍රමාණවත් අවදානම් ඇගයීම, හඳුනාගැනීම සහ අවමකිරීම සහතික කරනු ඇත.

1. අවදානම් හඳුනාගැනීම

අවදානම් හඳුනාගැනීමේ පරමාර්ථය වන්නේ ආයතනයක අරමුණු සාක්ෂාත් කරගැනීමට උපකාරී වන හෝ වළක්වා වන/බාධා ඇති කරවන අවදානම් සොයාගැනීම, හඳුනාගැනීම සහ විස්තර කිරීමයි. අවදානම් හඳුනාගැනීමේ දී ව්‍යාපාරයට අදාළ, සුදුසු සහ යාවත්කාලීන තොරතුරු වැදගත් වන අතර, අරමුණු එකකට හෝ වැඩි ගණනකට බලපාන අවිනිශ්චිතතාවයන් හඳුනාගැනීම සඳහා ආයතනයකට විවිධ වූ ක්‍රමවේදයන් භාවිතා කළ හැකිය.

2. අවදානම් විශ්ලේෂණය

අවදානම් විශ්ලේෂණයේ මූලික පරමාර්ථය වනුයේ අවදානමේ ස්වභාවය හා සුදුසු අවස්ථාවන්හිදි අවදානමෙහි බලපෑමේ ප්‍රමාණය ඇතුළු ලක්ෂණ අවබෝධ කර ගැනීම වන අතර, අවදානම් විශ්ලේෂණයට, අවිනිශ්චිතතාවයන්, අවදානම් ප්‍රභවයන්, ප්‍රතිවිපාක, සම්භාවිතාව, සිදුවීම්, අවස්ථා, පාලනයන් සහ ඒවායේ කාර්යක්ෂමතාව පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඇතුළත් වේ. තොරතුරුවල විවිධ බව, සංකීර්ණතාව, විශ්ලේෂණයේ අරමුණ මත පදනම්ව, තොරතුරු ලබාගැනීමේ හැකියාව සහ විශ්වසනීයත්වය හා පවතින සම්පත් මත විශ්ලේෂණය සිදුකළ හැකිය. අවස්ථාව හෝ වාතාවරණය මත හා අපේක්ෂාව මත විශ්ලේෂණ ශිල්පීය ක්‍රම ගුණාත්මක, ප්‍රමාණාත්මක හෝ මෙහි සංයෝජනයක් විය හැකිය.

3. අවදානම් ඇගැයීම

තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සහයෝගය ලබාදීම, අවදානම් ඇගැයීමේ මූලික අරමුණ ලෙස හැඳින්විය හැක. අවදානම් විශ්ලේෂණයේ ප්‍රතිඵල ස්ථාපිත අවදානම් නිර්ණායක සමඟ සංසන්දනය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල මත අවදානම් කළමනාකරණය සඳහා අමතර ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව හඳුනාගැනීම අවදානම් ඇගයීමේ ක්‍රියාවලියට ඇතුළත් වේ. එම තීරණ පහත පරිදි විය හැක.

- කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම.
- අවදානම් සඳහා ප්‍රතිකාර ක්‍රම සළකාබැලීම.
- අවදානමෙහි බලපෑම තවදුරටත් අවබෝධ කරගැනීම සඳහා වැඩිදුර විශ්ලේෂණය.
- පවත්නා පාලනයන් පවත්වාගෙන යාම.
- අරමුණු නැවත සළකාබැලීම.

4. අවදානම් ප්‍රතිකාර

අවදානම් ප්‍රතිකාර ක්‍රියාවලියෙහි පරමාර්ථය වන්නේ අවදානම විසඳීම සඳහා විකල්ප විසඳුම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම වේ. එහි පහත පරිදි පුනරාවර්තන ක්‍රියාවලියක් ඇතුළත් වේ.

- **අවදානම් ප්‍රතිකාර සඳහා** විකල්ප විසඳුම් සකස් කිරීම සහ තෝරාගැනීම.
- තෝරාගත් විකල්පය සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ක්‍රියාත්මක කරන ලද ප්‍රතිකාරයේ ඵලදායීතාවය තක්සේරු කිරීම.
- ඉතිරිව පවතින අවදානමෙහි බලපෑම ආයතනයකට පිළිගත හැකි ද යන්න තීරණය කිරීම.
- පිළිගත නොහැකි නම්, තවදුරටත් ප්‍රතිකාර ක්‍රම ක්‍රියාත්මක කිරීම.

අවදානම් තාප සිතියම (Risk Heat Map)



අවදානම් නිරාවරණය	අරමුණු	අවදානම් අවමකිරීමේ උපායමාර්ග
මූල්‍ය අවදානම් කළමනාකරණය		
1. ද්‍රවශීලතාවය සහ මුදල් කළමනාකරණය.	වෙළෙඳපොළ අවස්ථාවන්ට වේගවත් ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා ක්ෂණික අරමුදල් සැපයීමේ හැකියාව තහවුරු කිරීම.	දිගු කාලීන ණය මඟින් දිගුකාලීන වත්කම් සඳහා අරමුදල් සැපයීම.
	සෑම විටම "ප්‍රමාණවත්" ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීම.	සෑම විටම සංස්ථාවට කෙටි කාලීන ණය ගැනීමේ පහසුකම් ලබාගැනීම.
		වියදම් පාලනය සඳහා මුදල් බලතල වටිනාකම මත බෙදා ඇත.
		අනාගත අරමුදල් අවශ්‍යතා සඳහා ඇපකරයක් ලෙස ඉදිරිපත් කළ හැකි පොත් වටිනාකම්වලට වඩා සැළකිය යුතු ලෙස වෙළෙඳපොළ වටිනාකම් සහිත ඉඩම් සහ ගොඩනැගිලි සංස්ථාව සතුව ඇත.
		විවිධ මූල්‍ය ආයතන හරහා අරමුදල් අවශ්‍යතා සපුරාගැනීම.
2. පොළී අනුපාත අවදානම	පොළී අනුපාත අස්ථාවරත්වයේ අහිතකර බලපෑම් අවම කිරීම.	සංස්ථාවේ ආයෝජන සඳහා හැකි උපරිම පොළී අනුපාතය ලබාගැනීම සඳහා බැංකු සමඟ සාකච්ඡා කිරීම.
	ණයගැනීමේ පිරිවැය අවම මට්ටමක පවතින බව සහතික කිරීම.	ඉහළ පිරිවැය අවම කිරීම සහ දේශීය පොළී අනුපාතවල අහිතකර උච්චාවචනයන් වළක්වා ගැනීම සඳහා සැපයුම්කරුවන්ගේ ණය ලබාගැනීම හා සාකච්ඡා කිරීම.
	කොටස් මත ප්‍රතිලාභ ප්‍රශස්ත කිරීම.	අඩු ට්ෑරසබට අනුපාතයක් පවත්වා ගැනීම සහ ඵලදායී කාරක ප්‍රග්ධන කළමනාකරණය.

ව්‍යාපාර අවදානම් කළමනාකරණය		
3. කොවිඩ්-19 අවදානම	නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම.	සෞඛ්‍ය බලධාරීන් විසින් ලබාදී ඇති මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කිරීම.
	අඛණ්ඩව ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සහතික කිරීම.	වෛරස් බලපෑම පිළිබඳව කම්කරුවන් හට අවශ්‍ය දැනුම ලබාදීම.
		අහඹු සාම්පල මත ජ්ක්ෂ පරීක්ෂණ සිදුකිරීම.
		අමුද්‍රව්‍ය සහ අවසන් භාණ්ඩ සඳහා ස්වාරක්ෂක තොග පවත්වාගැනීම.
4. ණය අවදානම	ණය ගැතියන් ණය පැහැර හැරීම් ආශ්‍රිත අවදානම් අවම කිරීම.	ණය ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
		සියලුම ප්‍රධාන ගනුදෙනුකරුවන් සඳහා බැංකු ඇපකර, තැන්පතු සහ ඇපකරය ලබාගැනීම.
		ණය ලබාදීමට පෙර ගනුදෙනුකරුවන්ගේ ණය ලබාදීමේ සුදුසුකම් සහතික කිරීම සඳහා දැඩි තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.
		ණයගැතියාගේ ශේෂයන්සමීපව අධීක්ෂණය කිරීම, ක්‍රියාකාරී සැළසුම් සකස් කිරීම සහ එම ක්‍රියාකාරී සැළසුම් අපේක්ෂිත අන්දමින් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.
5. වත්කම් අවදානම	ගින්නෙන්, සොරකමින් සහ යන්ත්‍රෝපකරණ බිඳවැටීමේ අවදානම අවම කිරීම.	සියලුම සප්‍රශ්‍ය වත්කම් සඳහා පුළුල් රක්ෂණ ආවරණ ලබාගැනීම.
		අනිවාර්ය වැළැක්වීමේ නඩත්තු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
		ගිනි නිවීම වැනි ක්ෂේත්‍රවල නිරත සේවකයන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. අභ්‍යන්තර පාලනයන් හා බැඳි අවදානම	සංස්ථා වත්කම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වා ගැනීම.	පද්ධති විගණනය, තොග සහ මුදල් ගණනය කිරීම් ඇතුළු සියලුම විගණන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන පාලන යාන්ත්‍රණයන් සිදුකිරීම.
		සංස්ථාවේ කාර්යසාධනය එහි ඉලක්කවලට අනුකූල බව සහතික කිරීම සඳහා අයවැය ක්‍රියාවලියක් සහ අයවැය පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.
7. කීර්ති නාමය හා බැඳි අවදානම	කීර්ති නාමයට හානි පමුණුවන හේතූන් ඇතිවීම වැළැක්වීම.	නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අඛණ්ඩ පුහුණුව, තත්ත්ව කළමනාකරණය සහ සහතික කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
	අපගේ ක්‍රියාපටිපාටියෙන් බැහැරව කීර්ති නාමය පිළිබඳ අර්බුදයක් ඇති වුවහොත් එහි බලපෑම අවම කිරීම.	නිරතුරුව අභ්‍යන්තර හා බාහිර තත්ත්ව පරීක්ෂා සිදුකිරීම.
		නිෂ්පාදන පහසුකම් සඳහා අඛණ්ඩ ආයෝජන හා වැඩිදියුණු කිරීමේ පියවරයන් ගැනීම.
		බාහිර තත්ත්ව පාලන ආයතන මඟින් සහතික ලබා ගැනීම.
		ප්‍රමිතිගත නිෂ්පාදන ක්‍රියාවලියක් ස්ථාපනය.

8. මානව ප්‍රාග්ධනය හා කම්කරු අවදානම	බාධාවකින් තොරව අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාවලිය සහතික කිරීම.	දිරි දීමනා සහ සුභසාධක කටයුතු මගින් සේවක ප්‍රතිලාභ පුළුල් කිරීම.
	මානව සේවායෝජකයෙකු ලෙස අපව ප්‍රක්ෂේපණය කිරීම, අභිප්‍රේරණ කටයුතු සාර්ථකව ඉටුකිරීම, සංවර්ධනය කිරීම, රැඳවාගැනීම සහ ගුණාත්මක සේවක ප්‍රාග්ධනයක් ආකර්ෂණය කරගැනීම.	සේවක බැඳවාගැනීම්, කාර්යසාධන ඇගැයීම් සහ අභ්‍යන්තර මෙන්ම බාහිර පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් මානව සම්පත් අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම.
		කාර්ය සාධනය මත පදනම් වූ සංස්කෘතියක් සංස්ථාව තුළ ප්‍රවර්ධනය කිරීම.
9. තාක්ෂණික අවදානම	වර්තමාන තාක්ෂණික වර්ධනයන්ට අනුගතවීම සහ යල්පැණියාම වැළැක්වීම.	නව තාක්ෂණයන් සහ ස්වයංක්‍රීයකරණය සඳහා අඛණ්ඩ ආයෝජනය.
		වර්ෂය පුරා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කිරීම.
10. වෙළෙඳපොළ තරඟකාරිත්ව අවදානම	අපගේ වෙළෙඳපොළ කොටස උපරිම කිරීම.	ඉහළ ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.
	මූලික නිෂ්පාදනවලින් ජනනයවන ආදායම ඉහළ නැංවීම.	මිලගණන්වල තරඟකාරී බව සහතික කිරීම සඳහා නිෂ්පාදන ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩිකිරීම.
		අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෙළෙඳපොළ පර්යේෂණ සිදුකිරීම.
		වෙළෙඳ ප්‍රචාරණ සහ ඉලක්ක අලෙවිකරණය තුළින් සංස්ථා සන්නාමය තවදුරටත් ශක්තිමත් කිරීම.
		ප්‍රදර්ශනාගාරවල පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ වැඩසටහන් ස්ථාපනය.
11. පාරිසරික, දේශපාලනික සහ නියාමන අවදානම	අපගේ පාලනයෙන් බැහැරව ඇති බාහිර පරිසරයේ ඇති වන විචලනයන්ගෙන් ඇති විය හැකි සෘණාත්මක බලපෑම අවම කිරීම.	අදාල බලධාරීන් විසින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලවීම සහ අනුකූලතාවය සහතික කිරීම.
	නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීම.	ව්‍යවස්ථාපිත හා නියාමන ආයතනවල අවශ්‍යතාවයන්ට අනුකූලවීම.

ආයතනික සමාජ වගකීම

වගකීමෙන් යුතු රාජ්‍ය ආයතනයක් ලෙස, සියලුම බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ගේ වර්තමාන හා අනාගත පැවැත්ම අපගේ පැවැත්මට ද අත්‍යවශ්‍ය සාධකයක් බව අපගේ විශ්වාසයයි. ඒ අනුව දැව ව්‍යාපාරය තවදුරටත් වගකීමෙන් හා තිරසාර බැවින් වැඩිදියුණු කරමින් ආර්ථිකමය වශයෙන් දියුණුවක් ළඟා කරගැනීම සඳහා නව ක්‍රමෝපායන් ස්ථාපිත කිරීම අපගේ අරමුණ වේ.



පරිසරය කෙරෙහි අපගේ කැපවීම

වනවගාවන්හි නියැලී සිටින රාජ්‍ය ආයතනයක් ලෙස තිරසාර සංවර්ධනය සඳහා අප කැපවී සිටින අතර, සංස්ථාව මගින් සිදුකරනු ලබන සියලු ක්‍රියාකාරකම් පරිසරයට හිතකාමී අයුරින් සිදුවන බවට සහතික කිරීමට හැකි සෑමවිටම උත්සාහ දරන්නෙමු. අපගේ මෙහෙයුම් හා සංවර්ධනයන්ට සමගාමීව පරිසරය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ දියුණු කිරීම සඳහා අප උපරිම උත්සාහයන් දරන්නෙමු.

එම අරමුණු ඉටුකරමින් රාජ්‍ය දැව සංස්ථාව 2021 මූල්‍ය වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

රාජ්‍ය දැව සංස්ථාව පවත්වාගෙන යනුලබන පැල තවාන් මගින් නොමිලේ පැල බෙදාදීම.

රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශික 14 මගින් පැල තවාන් 26ක් නඩත්තු කෙරෙන අතර, ඒවායේ දැවමය වටිනාකමින් යුත් පැල නිෂ්පාදනය කෙරේ. මෙම පැල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත නොමිලේ නිකුත් කිරීම පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් සිදුකෙරේ.



කිතුල්ගල පැල තවාන



මිදලන පැල තවාන

රාජ්‍ය දැව සංස්ථාවේ කිතුල්ගල පැල හා මිදලන පැල තවාන් නිෂ්පාදනයන්

2021 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ තවාන්වල පැල 120,000 පමණ නිෂ්පාදනය සිදුකර ඇති අතර, පැල 31,268ක් රුක් රෝපණ වැඩසටහන් සඳහා නොමිලේ බෙදා දී ඇත.



රත්නපුර ප්‍රාදේශිකයේ බලංගොඩ,
ගොඩකුඹුර ප්‍රදේශයේ රුක්රෝපණ වැඩසටහන



කොළඹ ප්‍රාදේශිකයේ වග පාදුක්ක ප්‍රදේශයේ රුක්රෝපණ වැඩසටහන වැඩසටහන (කොළඹ විශ්ව විද්‍යාලයේ ආදිශිෂ්‍ය කණ්ඩායම හා Rotract club එක්ව සංවිධානය කරන ලදී)

සේවකයින් කෙරෙහි අපගේ කැපවීම

වැඩමුළු, පුහුණු වැඩසටහන්, පර්යේෂණ පිළිබඳ තොරතුරු

රාජ්‍ය දැව සංස්ථාවේ විවිධ අංශවල නිරවන නිලධාරීන් හට ක්ෂේත්‍රය තුළ පවතින ගැටළු විසඳීමේදී සහ ඉහළ නිලතල දැරීමේදී අවශ්‍ය වන දැනුම සහ කුෂලතා වර්ධනය කරගැනීම උදෙසා පර්යේෂණ, සංවර්ධන හා පුහුණු අංශය මගින් සේවකයන් විවිධ පාඨමාලා සඳහා යොමුකරවයි.

රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය මගින් පුහුණුව සහ තම ක්ෂේත්‍රයේ දැනුම වැඩිදියුණු කරවීමට අවශ්‍ය සේවකයන්, විවිධ පුහුණු සඳහා යොමුකිරීම සිදුකරන අතර, වැඩිදුරටත් අවශ්‍ය දැනම ලබාදීමට බාහිර ආයතනවල පුහුණු වැඩසටහන් සඳහා ද යොමුකරනු ලැබේ.

ඒ අනුව 2021 වර්ෂය සඳහා කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය මගින් සහ අනෙකුත් බාහිර ආයතනවල සම්පත් දායකත්වයෙන් සිදුකරනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා සේවකයන් යොමුකිරීම පහත පදිරි වේ.

පැවැත්වූ ආයතනය	පාඨමාලාව/වැඩමුළුව	පාඨමාලා/වැඩමුළු සංඛ්‍යාව	යොමුකරන ලද සේවක සංඛ්‍යාව
කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය හා අනුබද්ධව	වන සංගණනය හා GPS තාක්ෂණ	05	182
	ප්‍රදර්ශණාගාර පද්ධතිය	01	25
	මුදල් රෙගුලාසි	01	70
	දැව ඉරුම්හල් කියත් සැකසීම	01	32
	ප්‍රසම්පාදනය	01	57
	බාහිර උපදේශකයකු තෝරාගැනීම	01	47
	ණයට විකුණුම් පද්ධතිය	01	25
	අල්ලස් හෝ දූෂණ පනත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	02	105

(බාහිර ආයතන මගින්) SDFL, SLSI, NIBM, CETRAC, ප්‍රාග් ක්‍රම සම්පාදන, විශ්වවිද්‍යාල ආදිය	මානව සම්පත් කළමනාකරණය	52	137
	අලෙවිකරණය		
	ගිණුම්කරණය		
	ප්‍රසම්පාදනය		
	බොයිලේරු පුහුණුව		
	විනය ක්‍රියාපටිපාටිය		
	ආගන්තුක සත්කාර		
	කණ්ඩායම් ක්‍රියාකාරකම්		
	ගැටුම් කළමනාකරණය		
	අභ්‍යන්තර විගණනය		
	ප්‍රවාහන කළමනාකරණය		
	ඉංග්‍රීසි		
	වන විද්‍යාව හා අනෙකුත් පශ්චාත් උපාධි		
වන විද්‍යාලයේ පුහුණු	ඩිප්ලෝමා පාඨමාලාව	01	03
	සහතික පත්‍ර පාඨමාලාව	01	07
පුහුණු සඳහා යොමුකරන ලද මුළු සේවක සංඛ්‍යාව		**690**	

2021 වර්ෂයේ මෙහෙයවන ලද පුහුණු පාඨමාලා ගණන - 67

මුළු සේවක සංඛ්‍යාව - 690

පුහුණු සඳහා වැය කළ මුළු මුදල - රු. 3,045,123/-

මීට අමතරව පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය, චීනයේ NAFGA (National Academy of Forestry and Grassland Administration)ආයතනය සමඟ එක්ව රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් හට මාර්ගගත ක්‍රමයට පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර ඇත. එම වැඩසටහන පහත පරිදි වේ.

ආයතනය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
NAFGA - China (National Academy of Forestry and Grassland Administration)	Seminar on Forest Law Enforcement and Governance for Officials from Developing Countries	01	03
	Seminar on the Implementation of United Nations Forest Instrument (UNFI) and Sustainable Forest Management for Developing Countries	01	10
	Seminar on Natural Protected Areas Management and Biodiversity Conservation for the Belt and Road Initiative Countries	01	06
	Seminar on Climate Change and Sustainable Development for the Belt Road Initiatives	01	17
Total		**04**	**36**



මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන



අල්ලස් හෝ දූෂණ පණත පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



දැව ඉරුම්හල් හා කියත් සැකසීම පිළිබඳ වැඩසටහන



වන සංගණනය හා GPS තාක්ෂණය පිළිබඳ වැඩමුළුව

තවද, කර්මාන්තශාලා තුළ සහ වැඩබිම් ඇතුළු සේවා ස්ථානයේ සෞඛ්‍ය හා ආරක්ෂක පියවරයන් පිළිබඳව සේවක දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් නිරන්තරයෙන් පවත්වනු ලබන අතර, සෞඛ්‍ය හා ආරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කිරීමට සහ ප්‍රමිතීන් පවත්වා ගැනීමට සේවකයින් දිරිමත් කරනු ලැබේ. විචක්ෂණශීලි සේවා යෝජකයෙකු වන අප, සේවක වෛද්‍ය බිල්පත් ගෙවීමට හා හදිසි අනතුරු මගින් ඇතිවන පාඩු පියවා ගැනීමට අවශ්‍ය රක්ෂණ ආවරණ ලබාදී ඇත්තෙමු.

කොවිඩ්-19 වෛරසය ද්විතියික සම්ප්‍රේෂණය සහ පැතිරීම වැළැක්වීම පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම් මගින් සේවකයින් ආරක්ෂා කිරීමට සංස්ථාව කැපවී සිටී. තවද, වෛරසය පිළිබඳ තොරතුරු, අවදානම අඩු කරගන්නේ කෙසේද, වෛරසයේ රෝග ලක්ෂණ, සාමාන්‍ය ප්‍රතිකාර සහ වෙනත් වැදගත් තොරතුරු සේවකයන් අතර ප්‍රචාරණය කරන ලදී. මෙම කොවිඩ්-19 පාලන උපක්‍රමයන් සමඟ මුහුණු ආවරණය සහ සනීපාරක්ෂක දියර සියලුම සේවකයන්ට බෙදා දෙන ලදී.

ප්‍රජා සංවර්ධනය සඳහා අපගේ කැපවීම

ප්‍රජාව සංස්ථාවේ ප්‍රධාන පාර්ශවකරුවෙකු වන අතර, දැව කර්මාන්තයේ සාර්ථකත්වය සහ පැවැත්ම එහි දායකත්වය අත්‍යවශ්‍ය වේ. කල්පවත්නා නිෂ්පාදන කාණ්ඩයට අයත් දැව නිෂ්පාදන නිෂ්පාදකයෙකු ලෙස, සමස්තයක් ලෙස සමාජයට ප්‍රතිලාභ ලබාදෙමින් ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම සඳහා සාධාරණ මිලකට උසස් තත්ත්වයේ නිෂ්පාදන සැපයීම අපගේ වගකීම වේ.

2021 වර්ෂය සඳහා සිදුකරන ලද දැව සම්බන්ධ පරීක්ෂණ

පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය 2021 වසරේදී දැව විද්‍යාව, වන විද්‍යාව, අලෙවිකරණය, පරිසර විද්‍යාව ආදී ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු රාශියක් සිදුකර ඇති අතර, මෙම පර්යේෂණ බොහොමයක සොයාගැනීම් හා ප්‍රතිඵල පර්යේෂණ පත්‍රිකා මගින් ඵල කර ඇති අතර, ඇතැම් පර්යේෂණ පලකිරීම සඳහා යොමුකර ඇත. 2021 වසර තුළ පලකරන ලද පර්යේෂණ පත්‍රිකා පහත පරිදි වේ.

Journal papers

- Muthumala, C. K., Sudhira De Silva, P.L. A. G. Alwis, and K. K. I. U. Arunakumara 2021. Failure Modes and Compression Strength of Seven Finger-Jointed Wood Species from Sri Lanka, J Fail. Anal. and Preven. https://doi.org/10.1007/s11668-021-01274-9 springer journal

- Muthumala, C.K., De Silva, S., Alwis, P.L.A.G. and Arunakumara, K.K.I.U. 2021. Identification of the best finger joint configuration for Sri Lankan wood species based on the flexural strength. J Indian Acad Wood Sci (2021). https://doi.org/10.1007/s13196-021-00284-2. Springer journal

- Muthumala, C.K., Arunakumara, K.K.I.U., De Silva, Sudhira. and Alwis, P.L.A.G. 2021. Assessment of finger-joint efficiencies in Sri Lankan timber species, The Sri Lanka Forester, Forest Department, Sri Lanka. Vol. 40, 2021 pp.57 – 70.

- Muthumala, C.K., Arunakumara, K.K.I.U., De Silva, Sudhira. and Alwis, P.L.A.G. 2021. Investigation of the strength parameters and physical properties of timber species in Sri Lanka, The Sri Lanka Forester, Forest Department, Sri Lanka. Vol. 40, 2021 pp.57 – 70.

- Muthumala, C.K., De Silva Sudhira., Arunakumara K.K.I.U. and Alwis P.L.A.G. 2021. Evaluation of the failure modes of the finger-jointed timber species for utilization of waste timber. International Conference On Innovations in Energy Engineering & Cleaner Production, 2021, San Francisco, CA – USA.
- W.V. Tharindu Amarasinghe, Toru Terada, and Hirokazu Yamamoto (2021). Enhancing the carbon sequestration of high-elevation Eucalyptus plantations in Sri Lanka for future carbon market activities. Journal of Forest Research, 26(1):1-7. DOI: 10.1080/13416979.2021.1927501

Abstract papers in symposia and conferences

- Muthumala C.K.. 2021. Identification of Jack (Artocarpus heterophyllus) and Bedidel (Artocarpus nobilis) timber species using anatomical features, International Symposium on Agriculture and Environment 2021 University of Ruhuna, Sri Lanka, p.84.

- Muthumala, C.K., De Silva Sudhira., Arunakumara K.K.I.U. and Alwis P.L.A.G. 2021. Assessment of the mix timber combination effect of finger–jointed timber species using flexural and tensile strength, International Conference on Structural Engineering and Construction Management, Kandy, Sri Lanka.

- Amarasinghe W.V.T.D. and Muthumala C.K. (2021). Assessment of the Wastage in the Sawmilling Industry of Sri Lanka, a Case Study of STC Sawmills. International Conference on Environmental Good Governance, Colombo, Sri Lanka

- Balasooriya L.S., Amarasinghe W.V.T.D., Weerakkody J. and Muthumala C.K. (2021). A New Bucking Approach to Improve Teak (Tectona grandis) Grading: A Case Study In Kurunegala District. Open University Research Sessions 2021 (OURS 2020).

- Jinadari W.M., Weerakkody J, Amarasinghe W.V.T.D. and Muthumala C.K. (2021). Above Ground Carbon Stock Estimation of Intermediate Zone Teak (Tectona grandis) Grown in Sri Lanka. Open University Research Sessions 2021 (OURS 2020).

- Lecture Notes in Civil Engineering

- Muthumala, C.K., Amarasinghe W.V.T.D. and Mudalige T.S. (2021). Assessment of Wood Properties in Lesser-Known Shorea spp. in Sri Lanka. ICSBE 2020 - Lecture Notes in Civil Engineering Chapter: Sustainable Material and Manufacturing Publisher: Springer Nature Singapore Pte Ltd. DOI: 10.1007/978-981-16-4412-2_36

Magazines

- සී.කේ.මුතුමාල (2021) අධිවේගය මන්දගාමී කළ පණුකරුඳ ශාකය. සොඛා. පරිසර ප්‍රකාශනය. පළමු කලාපය, **xxx** වන වෙළුම, පරිසර අමාත්‍යංශය.

පයිනස් දැව පරිරක්ෂණය හා කල්පැවැත්ම වැඩිකිරීම උදෙසා නව පර්යේෂණ මාලාවක් ආරම්භ කළ අතර, ඒවා තවදුරටත් සිදුකරමින් පවතී.



පයිනස් දැව ගිල්වීමේ ක්‍රමයෙන් බෝරෝන් පරිරක්ෂණය කිරීමේදී විවිධ කාල පරාසවල ගිල්වා තැබීමේ බලපෑම පරික්ෂා කිරීම.



පයිනස් දැව ගිල්වීමේ ක්‍රමයෙන් බෝරෝන් පරිරක්ෂණය කිරීමේදී විවිධ සාන්ද්‍රණවල ගිල්වා තැබීමේ බලපෑම පරික්ෂා කිරීම.

මෙම පරීක්ෂණ වල ප්‍රතිඵල දැව හා වන විද්‍යා ක්ෂේත්‍රවල අධ්‍යනයන් කරන සිසුන්ට හා පර්යේෂකයන්ට ඉතා වැදගත් වන අතර එම සොයාගැනීම් රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රායෝගික ක්‍රියාවලීන් සඳහා යොදා ගනු ලැබේ.

පයිනස් දැව භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව ශ්‍රී ලංකාවේ පයිනස් දැව ඉවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කර ඇති අතර, මේ හේතුවෙන් කෙටි කාලයක් තුළ විශාල පයිනස් දැව අස්වැන්නක් දේශීය වෙළෙඳපොළ වෙත නිදහස්වීමට නියමිත වේ. නමුත් දේශීය දැව වෙළෙඳපොළ තුළ පයිනස් දැවවල ගුණාත්මකත්වය භාවිතයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති බව නිරීක්ෂණය වන අතර, එම දැව පිළිබඳ දුර්මත ද දක්නට ඇත. මේ හේතුවෙන් රටේ ජනතාව හා දැව කර්මාන්තයේ නියුතු කාර්මිකයන් හට පයිනස් දැව භාවිතය පිළිබඳ නිවැරදි දැනුම ලබාදීමේ වැඩසටහන් රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධණ හා පුහුණු අංශය මගින් ආරම්භ කර ඇත. ඒ සඳහා විශේෂ දැනුවත් කිරීමේ පත්‍රිකාවක් ද සකසා මුද්‍රණය කර බෙදාහැර ඇත.





බහිර පාර්බාහිර පාර්ශව වෙත තාක්ෂණික සහාය ලබාදීම

රාජ්‍ය දැව සංස්ථාවට හා බාහිර ආයතන වෙත අවශ්‍ය දැව හා වන විද්‍යාව සම්බන්ධ තාක්ෂණික සහය ලබාදීම සිදුකරයි. එහිදී එම ආයතනවල දැව මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියන්ට සහායවීම, දැවමය අයිතම සඳහා නිර්ණායක සැකසීම, වෙනත් උපදේශණ ලබාදීම සිදුකරන අතර, 2021 වසරේදී එසේ සහය ලබාදුන් ආයතන පහත පරිදි වේ.

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය (SLITE)
- අධ්‍යාපන අමාත්‍යාංශය
- ජාතික විද්‍යා පදනම

දැව හඳුනාගැනීම හා දැව වාර්තා පිළිබඳ තොරතුරු

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ සංවර්ධන හා පුහුණු අංශය මගින් නවීන තාක්ෂණය යොදාගනිමින් දැවවල අභ්‍යන්තර පටක කොටස් පරීක්ෂා කොට ඒවායේ පටක ව්‍යුහාත්මක විශ්ලේෂණ මගින් දැව හඳුනාගැනීම සිදුකෙරේ. වසරකට දැව හඳුනාගැනීමේ සහතික පත්‍ර හා අනෙකුත් වාර්තා 150-200 ක් අතර ප්‍රමාණයක් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට මේ යටතේ නිකුත් කිරීම සිදුකරයි. දැව හඳුනාගැනීමට අමතරව දැවවල ශක්ති ගුණාංග විශ්ලේෂණය සඳහා වන MOR, MOE, Compression test, Density tests, Tension tests ආදිය ද, කල්පැවැත්ම හා පරිරක්ෂණය සම්බන්ධ Boron Test, CCB Test ආදී පරීක්ෂණ කටයුතු ද සිදුකෙරේ.



පටක විද්‍යාත්මක ලක්ෂණ අනුව හඳුනාගැනීම

දැව ව්‍යුහාත්මක ලක්ෂණ භාවිතයෙන් දැව වර්ග හඳුනාගෙන ඒ අනුව 2021 වර්ෂය සඳහා පහත දැක්වෙන වාර්තා නිකුත් කර ඇත. පරිරක්ෂණය කරන ලද සාම්පල් ගණන 193 වේ.

වාර්තා	නිකුත් කර ඇති වාර්තා ගණන
දැව හඳුනාගැනීම	96
තෙතමන පරීක්ෂාව	30
ඝණත්ව පරීක්ෂාව	16
බෝරෝන් පරීක්ෂාව	12
CCB පරීක්ෂාව	05
දැවවල ශක්ති පරීක්ෂාව	13
අනෙකුත් දැව වාර්තා (බාහිර ආයතන වෙත ගොස් සිදුකරන ලද හා තාක්ෂණික වාර්තා)	21
එකතුව	**193**

ව්‍යාපාර සාරාංශය

ආදායම් වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය





ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය







නිෂ්පාදන ප්‍රවර්ධන ප්‍රවණතා විශ්ලේෂණ













ප්‍රාග්ධන වියදම් - 2021

විස්තරය (රු මිලියන 20ට වඩා වැඩි)	රු
ඉඩම් - කුරුණෑගල ප්‍රාදේශිකය	32,600,472
ලොග් ලෝඩර් - අම්පාර ප්‍රාදේශිකය	27,930,000
අට්ටිමඩු - නුවර ප්‍රාදේශිකය	9,371,094
Clamp carrier machine - කල්දෙමුල්ල ගෘහභාණ්ඩ ඒකකය	4,524,100
කුඩුම්බිවිදින යන්ත්‍රය - කල්දෙමුල්ල ගෘහභාණ්ඩ ඒකකය	4,060,000
කුඩුම්බිවිදින යන්ත්‍රය - බූස්ස ගෘහභාණ්ඩ ඒකකය	4,060,000
Graffle unit - අනුරාධපුර ප්‍රාදේශිකය	3,240,000
කොන්ක්‍රීට් පාර - අම්පාර ප්‍රාදේශිකය	3,054,850
CCTV පද්ධතිය - ප්‍රධාන කාර්යාලය	2,999,625
කොන්ක්‍රීට් පාර - මැල්සිරිපුර ඩිපෝව	2,982,945
කොන්ක්‍රීට් පාර - කණ්කානියමුල්ල ඩිපෝව	2,823,208

ආයෝජන	31-12-2021	31-12-2020
භාණ්ඩාගාර බැඳුම්කර	346,843,350	-
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	232,747,814	219,691,174
ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	500,000	500,000
මහජන බැංකුව	1,828,073,777	785,754,782
ලංකා බැංකුව	2,606,347,769	1,486,003,969

දශකයක තොරතුරු (නිරපේක්ෂ සංඛ්‍යා)

		2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
මුළු වාර්ෂික ආදායම	රු. '000	3,563,390	3,213,644	3,756,482	4,132,052	4,522,238	4,630,718	4,457,024	4,608,413	4,372,033	5,996,789
වාර්ෂික දළ ලාභය	රු. '000	1,546,107	1,197,518	1,453,450	1,757,115	2,045,090	2,075,950	1,964,647	1,890,812	1,745,766	2,753,682
භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ලාභය	රු. '000	801,681	382,337	427,222	768,699	659,732	966,804	672,433	512,947	569,521	1,496,156
මුළු සේවක පිරිවැය	රු. '000	1,065,052	1,117,036	1,254,516	1,449,749	1,789,572	1,572,775	1,553,598	1,584,418	1,640,020	1,580,855
වාර්ෂික ප්‍රාග්ධන වියදම්	රු. '000	162,509	332,870	115,132	244,929	113,675	94,637	116,034	319,485	104,712	126,547
වර්ෂාවසාන ජංගම නොවන වත්කම්	රු. '000	1,479,880	1,658,535	1,654,908	1,743,580	1,732,640	1,894,597	1,978,855	2,581,165	1,966,637	2,158,971
වර්ෂාවසාන ජංගම වත්කම්	රු. '000	2,929,185	3,153,777	4,004,860	4,115,259	3,652,116	4,423,105	4,541,610	4,640,889	5,319,557	7,048,847
වර්ෂාවසාන ජංගම වගකීම්	රු. '000	804,102	1,050,258	1,591,991	1,480,966	897,087	1,234,716	1,047,668	967,481	985,365	1,791,411
වර්ෂාවසාන ජංගම නොවන වගකීම්	රු. '000	409,030	384,831	484,649	424,854	499,373	852,292	812,441	714,022	836,197	659,200
වර්ෂාවසාන ස්කන්ධය	රු. '000	3,195,933	3,377,223	3,583,129	3,953,019	3,988,297	4,230,694	4,660,357	5,540,551	5,464,633	6,757,207
ඒකාබද්ධ අරමුදලට දායකත්වය	රු. '000	600,000	50,000	25,000	50,000	175,000	100,000	100,000	50,000	511,026	100,000
වර්ෂාවසාන සේවක සංඛ්‍යාව	ගණන	2,187	2,139	2,186	2,145	2,125	2,083	2,001	1,803	1,708	1,606
ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක											
ස්කන්ධය භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය	%	25.08	11.32	11.92	19.45	16.54	22.85	14.43	9.26	10.42	22.14
මුළු වත්කම්වලට භාණ්ඩාගාර සහ ආදායම් බදු පෙර ශුද්ධ ලාභය	%	18.18	7.94	7.55	13.12	12.25	15.30	10.31	7.10	7.82	16.25
ජංගම අනුපාතය	වාර ගණන	3.64	3.00	2.52	2.78	4.07	3.58	4.33	4.80	5.40	3.93
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය	%	3.73	3.78	3.64	6.31	0.66	3.84	6.59	12.19	8.00	16.25
මුළු පිරිවැටුම් වර්ධනය	%	14.81	(9.81)	16.89	10.00	9.44	2.40	(3.75)	3.40	(5.13)	37.16

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්ඩබ්ලිව්/ඒ/එස්ටීඕ/එෆ්ඒ/2021/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජූනි 12 දින



සභාපති,

රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.ඒ. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : ලේකම් - වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොළduwa පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එෆ්ඩබ්ඒල්/ඒ/එස්ටීසී/එෆ්ඒ/2021/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූනි 17 දින

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය දැව සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්,සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාව තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07

i. වර්ෂය තුළදී කෙරීගෙන යන වැඩ ගිණුමෙන් (Capital work in progress) රු.5,561,222 ක් ජංගම නොවන වත්කම් සඳහා ප්‍රාග්ධනීත කර තිබුණද, එමගින් මුදල් ගලාඒමක් හෝ මුදල් ගලායාමක් සිදු නොවන නමුත්, මුදල් ගලාඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.

ii. සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.136,086,521 ක සේවක ණය ලෙස ලබා දී තිබුණු අතර, රු.146,979,660 ක සේවක ණය නැවත අයකරගෙන තිබුණි. එම මුදල් ගලායාම සහ එම මුදල් ගලාඒම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණි.

iii. ආයෝජන ආදායම්වලින් මුදල් ගලාඒම් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.232,435,163 ක් ගලපා තිබුණු නමුත්, ඒම වටිනාකම් තුළ එස්කැම්ප් ව්‍යාපෘතියෙන් (Scamp project) 2021 වර්ෂය සඳහා ලැබිය යුතු කුලී ආදායමින් මුදලින් නොලද රු.3,624,266 ක කුලී ආදායම් මුදල් ගලාඒමක් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව අවසන් තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු අතර, අවසන් තොගයේ පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය අඩුවන විට, එම වෙනස වියදමක් ලෙස ලාභයෙන් කපා හල යුතු වුවත්, ප්‍රමිතියට පටහැනිව සංස්ථාව විසින් වෙළඳ තොග සඳහා, තොග නශ්‍යවීම වෙනුවෙන් සියයට 15 ක ප්‍රතිශතයක් වෙන්කර තිබුණි. පසුගිය වර්ෂවල සිට අනුගමනය කරමින් පැවති එම වැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2021 වර්ෂයේදී අනුගමනය කර නොතිබුණු අතර ඉකුත් වර්ෂවලදී, තොග නශ්‍යවීම් වෙනුවෙන් කරන ලද රු.244,674,913 ක වෙන්කිරීම් ගැලපීම් සිදු නොකර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද තොගයෙන් අඩුකර දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 42(b) වගන්තිය ප්‍රකාරව, පූර්ව වර්ෂවල ප්‍රමාණාත්මක වැරදි නිවැරදි කිරීමේදී, පෙර වර්ෂයේ වත්කම්, වගකීම්, සහ හිමිකම් ගිණුම්වල ආරම්භක ශේෂයන් නැවත ස්ථාපිත කිරීම් (Restating) සිදුකළ යුතු වුවත්,

සංස්ථාව විසින් තොග සම්බන්ධ වරද නිසියාකාරව නිවැරදි නොකිරීම නිසා, පසුගිය වර්ෂ 10 කදී සංස්ථාවේ ශුද්ධ ලාභය රු.182,376,560 කින් උෙන ගණනය වී තිබුණි.

(ඇ) අමිපාර ගෘහ භාණ්ඩ සංකීර්ණයෙහි රු.114,258,780 ක් වටිනා අයිතම 5465 කට අදාල අර්ධ නිමි භාණ්ඩ තොගයක්, භෞතික සත්‍යාපනයකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල අවසන් තොගයට එක්කර තිබුණි.

(ඉ) 2021 වර්ෂයට අදාලව කෙටිකාලීන හා දිගුකාලීන ආයෝජන වලින්සමාලෝචිත වර්ෂයට ලැබියයුතු පොලී ආදායම රු.122,957,700 ක් වුවද, රු.124,495,091 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයෙහි පොලී ආදායම රු.1,537,391 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දැවල ඇතුළත් වෙනත් ණය හිමියන් තුළ අන්තර්ගත විකුණුම් අත්තිකාරම් රු.131,176,540 කින්, රු.103,246,849 ක අත්තිකාරම් පියවා ඇතත්, එම වටිනාකම් විකුණුම් අත්තිකාරම් ගිණුමට හර නොකර, අත්පිට විකුණුම් පාලන ගිණුමට හර කිරීම නිසා, විකුණුම් ආදායම හා විකුණුම් අත්තිකාරම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල පිරියත උපකරණ අයිතමයන්හි ඵලදායි ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.796,253,922 ක් වූ දේපළ පිරියත උපකරණවල ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත්, නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබෙනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර

කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කෑමේ හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට දායක කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටී සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවනප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙනනාන්වීන මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන්හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂාවි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ

පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල,පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුෂාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව	**විස්තරය**
1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 8(1) වගන්තිය	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 8(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව තාවකාලිකව බදවා ගන්නා ලද සේවකයින් සඳහාද සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් අඩු කර ආයතනයේ

දායකත්වය සමඟ යැවීමට කටයුතු කළයුතු වුවත් රාජ්‍ය දැවසංස්ථාව විසින් දෛනික වැටුප් ක්‍රමය මත සේවයට බඳවා ගන්නා ලද සේවකයින් 192 දෙනෙකු සම්බන්ධයෙන් එලෙස සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

සංස්ථාවේ අරමුණු අතරින් කෘෂිකාර්මික නිෂ්පාදන, වේවැල් අපනයනය යන අරමුණු ඉටුකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොමැති අතර අපේක්ෂිත පරිදි දැව අතුරු හාණ්ඩ නිෂ්පාදනය හා අලෙවියද සිදු කර නොතිබුණි. එමෙන්ම දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි හාණ්ඩ අපනයනය කිරීම සංස්ථාවේ අරමුණක් වුවද එම අරමුණු ඉටු කර ගැනීම සඳහා සංස්ථාව කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ යම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2007 සිට 2013 වර්ෂයේ දෙසැම්බර් දක්වා ගොඩනැගිලි කුලිය සංස්ථාව විසින් නිසි පරිදි අයකර ගෙන තිබූ නමුත් 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ගොඩනැගිලි කුලිය රු.89,502,660 ක් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට දැව සැපයුම්කරුවන්ට ලබාදුන් අත්තිකාරම් මුදල රු.21,823,345 ක් වූ අතර ඉන් රු.9,843,560 වර්ෂ 02 සිට 05 ඉක්ම වූ අත්තිකාරම් විය. ඒවා අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඇ) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුදල රු.1.731.821 ක් වූ අතර, ඉන් රු.1.661.488 ක් වර්ෂ 03 ට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඈ) රන්නපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදෙන ලද අත්තිකාරම් වලින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුදල රු.2.588.632 ක් විය. ඉන් වර්ෂ 2ක ඉක්මවූ ශේෂය රු.1,953,882 විය.

(ඉ) අම්පාර ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයෙහි විකුණුම්. මුදලට මෙන්ම ණයට ද සිදු කර තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට ණයට විකුණුම්වලින් අයවීමට ඇති වටිනාකම් රු.13,091,111 ක් වන අතර, ඉන් රු.7,767,938 ක් වර්ෂ 02 ක් ඉක්මවා තිබුණි. මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 67 කට අදාලව පුරප්පාඩු 717 ක් පැවතුණු අතර, ඉන් 79 කට වැඩබැලීම් සඳහා පත්වීම් ලබා දී තිබුණි. වැඩබැලීම් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය නොමැතිව 44 දෙනෙකුට රු.4,694,492 ක වැඩබැලීමේ දීමනාවක් ගෙවා තිබුණි.

(උ) 2018 වර්ෂයේ රොඛගිල් වැඩබීමේ යුකලිප්ටස් වර්ගයේ ගස් 2172 ක් පූර්ණ හෙළීමේදී හා විකිණීමේ දී සිදුවී ඇති අක්‍රමිකතා නිසා සංස්ථාවට රු.6,851.081 ක ආදායමක් අහිමි වීම සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකොට ඊට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) කල්දෙමුල්ල, බුස්ස, අම්පාර යන ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාර 03 කට සමාලෝචිත වර්ෂයේදී ඇණවුම් 395 ක් ලැබී තිබූ අතර, ඉන් ඇණවුම් 99 ක් හෙවත් සියයට 25 කට සමාන ප්‍රමාණයක් වර්ෂය තුලදී නිමකර නොතිබුණි. තවද, කල්දෙමුල්ල, බුස්ස හා අම්පාර ප්‍රදර්ශනාගාරවලට ලැබිතිබූ ඇණවුම් පිළිවෙලින් 147 ක් 158 ක් හා 90 ක් වූ අතර පිළිවෙලින් ඉන් 135 ක් 143 ක් හා 81 ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටුකරවා ගෙන තිබුණි. ප්‍රදර්ශනාගාරවල සේවකයින් විසින් සංස්ථාව වෙත ගෙන ආ ඇණවුම් ප්‍රමාණය 36 ක් පමණක් වූ අතර, ප්‍රදර්ශනාගාරවලට අනුයුක්ත සේවකයන්ට රු.70,466,547 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඒ) භෞතික තොග සත්‍යාපනය

i. වාර්ෂික සාමාන්‍ය අලෙවිය හා වෙළඳපොළ මිල තත්ත්වය සැලකිල්ලට ගෙන නිෂ්පාදන සැලසුම් සකස් නොකර වර්ෂයතුල නිෂ්පාදනය වැඩි කිරීම තුලින් 2021 දෙසැම්බර් 31 දිනට රු.440,349,304 ක් වටිනා ගෘහභාණ්ඩ තොගයක් කල්දෙමුල්ල, බුස්ස, අම්පාර නිෂ්පාදනාගාරවල ගොඩගසා තිබුණි. ඉන් වටිනාකම රු.14,265,277 ක් වූ භාණ්ඩ අයිතම 464 ක් දෝෂ සහිත භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබුණු අතර වර්ෂ 10 කට වඩා පැරණි භාණ්ඩද එය තුළ විය.

ii. සන ඩෙසිමීටර් 400,808 ක් අඩංගු පරිත්‍යාග දැව කඳන් 3040 ක් අම්පාර දැව ගබඩා භූමිය තුල නැන නැන ගොඩගසා ඇති බවත් ඉන් සමහර තොග 2014 වර්ෂයේ සිට පැවැතෙන කඳන් බවත් විගණනයට නිරීක්ෂණය විය.

(ඓ) සංස්ථාව ස්ථාපිත කරන ලද 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික ආඥා පනත මඟින් නෛතිකව පවරා ඇති ප්‍රධාන කාර්යයන් සඳහා අවධානය යොමු නොකොට බාහිර පාර්ශවයන් විසින් නිෂ්පාදිත රු.511,875 ක වටිනාකමකින් යුත් විසිතුරු භාණ්ඩ තොගයක් මිලදී ගෙන විකිණීමට සංස්ථාවේ නිලධාරීන් කටයුතු කර තිබුණි.

(ඔ) අම්පාර නිෂ්පාදනාගාරයෙහි වැද්දුම් අංශයේ 2018 වර්ෂයට පෙර සිට පවතින වැඩ අවසන් නොකරන ලද රු.109,587,380 ක් වූ අයිතම 90 ක් හා වැඩ නිමකරන ලද රු.36,374,180 ක් ලෙස රු.145,961,150 ක් නිෂ්ක්‍රියව තිබුණි.

(ඕ) වටිනාකම රු.8,830,974 ක් වූ සන ඩෙසිමීටර් 286,168 ක කළුවර දැව තොගයක් දැව සංස්ථාවේ නිෂ්පාදනාගාරවලට හෝ ජාතික ශිල්ප සභාවට භාරදීමට කටයුතු නොකර සංස්ථා දැව ගබඩාවල රඳවාගෙන තිබුණි.

(ක) බුස්ස ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයේ පවතින වායු සමීකරණ 08 න්, වටිනාකම රු.1,154,944 ක්වූ වායු සමීකරණ 07 ක් 2018 වර්ෂයේ සිට ක්‍රියාවිරහිතව භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතියද ඒවා අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ග) සමාලෝචිත වර්ෂය අවසානයට වන අපරාධ ලෙස ලැබුණු රු.114,056,534 ක් වූ ඉරු දැව සන ඩෙසිමීටර් 1,112.166 ක් හා රු.65,601,485 ක් වූ වටිනා දැව කඳන් සන ඩෙසිමීටර් 3,586.873 ක් ගබඩා වල රඳවා ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් 2018

ඔක්තෝබර් 10 දිනැති අංක 422 දරන අධිකරණ සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව අධිකරණය දැනුවත් කර අධිකරණ නියෝගයක් ලබා ගෙන මෙම දැව විකුණා ලබා ගන්නා මුදල් නඩු කටයුතු අවසන් වන තුරු අධිකරණයේ භාරයේ තැන්පත් කිරීමට හෝ එම දැව වල වටිනාකම ආගණනය කර තොග පොත්වලට ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

